# සමාජ එක්සත්භාවය සහතික කිරීමේදී ජනමාධ්‍යයේ කාර්යභාරය*

**පී. එම්. එස්. එච්. ප්‍රියදර්ශනී**[1]

**සංක්ෂේපය**

සමාජ චර්යාවන් කෙරෙහි බෙහෙවින් බලපෑම් සහගත මෙවලමක් වශයෙන් සන්නිවේදනය පමණක් නොව, අනෙකුත් මානව අවශ්‍යතා රාශියක් ආමන්ත්‍රණය කරන බහුකාර්ය උපකරණයක් බවට ජනමාධ්‍ය ප්‍රවර්ධනය වී තිබේ. නූතන ශ්‍රී ලාංකේය සමාජය කෙරෙහි ජනමාධ්‍ය විසින් ඇති කරන කෘත්‍යාත්මක බලපෑම අතර දේශපාලනික, ආර්ථික හා සමාජීය වශයෙන් සහජීවනයෙන් හා ඒකාග්‍ර වූ සාධාරණ සමාජයක් ගොඩ නැගීමට ජනමාධ්‍යට වගකීමක් ඇත. සමාජ එක්සත්භාවය නම්, ජාතිය, වර්ණය, ආගම, ස්ත්‍රී පුරුෂ භාවය, පංතිය, කුලය හෝ වෙනත් සමාජ සලකුණු නොසලකා සැමට සමෘද්ධිමත් විය හැකි පරිසරයක් නිර්මාණය කිරීමයි. සමාජයන් තුළ එක්සත්භාවය සහතික කිරීමේදී ජනමාධ්‍යයට තීරණාත්මක කාර්යභාරයක් ඇත. ජනප්‍රිය ජනමාධ්‍ය සහ සමාජ එක්සත්භාවය අතර සම්බන්ධය අපරාධ සහ දුරාචාරය වැනි සෘණාත්මක ක්‍රියාකාරකම් ඉවත් කිරීමට පහසු වන අතර සහජීවනයට සහ ප්‍රජාවට ධනාත්මක දායකත්වයක් ලබා දීමට මග පෙන්වයි. නිවැරදි තොරතුරු සැපයීම, සංවාදයට පහසුකම් සැලසීම සහ අදහස් දිරිමත් කිරීම මගින් සමාජ සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමේදී මාධ්‍යයට කාර්යභාරයක් ඉටු කළ හැකිය. පොදු සාරධර්ම, ඉලක්ක, අත්දැකීම් බෙදා හරින විට සමාජ බැඳීම් ශක්තිමත් කිරීමට සහ විවිධ පසුබිම්වල පුද්ගලයන් සමගියෙන් එකට ජීවත් වීමට දිරිගැන්වීමට ද ජනමාධ්‍යයට හැකි වේ. විශ්වාසය සහ සමාජ ප්‍රාග්ධනය, හවුල් වටිනාකම් සහ අනන්‍යතාවය, විවිධත්වය, ආර්ථික සමානාත්මතාවය, ගුණාත්මක අධ්‍යාපනයට සමාන ප්‍රවේශය, සමාජ සේවා සහ සුබසාධනය, ක්‍රියාකාරී සහභාගීත්වය යන ගුණාංග එක්සත්භාවය ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය ප්‍රධාන අංග ලෙස හඳුනා ගනී. නිවැරදි තොරතුරු සැපයීම, භාෂා විවිධත්වය, විවිධ නියෝජනය, සංවාදය සහ විවාදය ප්‍රවර්ධනය කිරීම, සමාජ සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටීම, ප්‍රජා සහභාගීත්වය, ජාතිය ගොඩනැගීමේ මූලපිරීම්වලට ප්‍රමුඛත්වය දීම, ජනවාර්ගික අර්බුද වාර්තා කිරීම සහ ගැටුම් නිරාකරණය සමාජ එක්සත්භාවය ප්‍රවර්ධනය කිරීමේ ජනමාධ්‍ය භූමිකාව ලෙස හඳුනා ගැනේ. ප්‍රශ්නාවලි ක්‍රමය ප්‍රධාන දත්ත ලබා ගැනීමේ විධික්‍රමය ලෙස යොදා ගනිමින්, අභිමතානුසාරී නියැදියට අනුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තරුණ සිසුන් 50 දෙනෙකු ආශ්‍රයෙන්, දත්ත එක් රැස් කිරීම සිදු කෙරිණි. සමාජ එක්සත්භාවය සඳහා ජනමාධ්‍ය මගින් සැලකිය යුතු කාර්යභාරයක් සිදුකරන බව තරුණ විෂයෙහි පිළිගැනීමක් ඇති බව තෝරාගත් නියැදිය ප්‍රමාණාත්මක හා ගුණාත්මක විශ්ලේෂණයට භාජනය කිරීමෙන් අනතුරුව නිගමනය වූ නමුත් රටක සංවර්ධනයට වඩාත් මග කියන සමාජ එක්සත්භාවය සඳහා ජනමාධ්‍ය යොදා ගැනීමේ අවශ්‍යතාවය තවත් දිශා ඔස්සේ පුළුල් විය යුත්තේය.

***මුඛ්‍ය පද:*** *කාර්යභාරය, ජන මාධ්‍ය, සමාජය, සමාජ එක්සත්භාවය, සහජීවනය*

[1] *ප්‍රදර්ශක (තාවකාලික), ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය. Email:* shelumfernando@gmail.com

**හැඳින්වීම**

**අධ්‍යයනයේ පසුබිම**

සමාජය වූ කලී ස්ථිතික නොවන ගතික වූ පුද්ගල එකතුවකින් සැදුම් ලද්දකි. සමාජය තුළ එකතු වී සිටින පුද්ගලයන් අතර එක්තරා ආකාරයකට ගොඩ නැගුණු සම්බන්ධතාවන්ගේ සංකලනයක් දැකිය හැකිය. සමාජයක පැවැත්ම උදෙසා ගැටුමෙන් තොරව සාමය සාමදානය ප්‍රවර්ධනය කිරීම වැදගත් වේ. එවිට සමාජ එක්සත්භාවය මනාව සිදුවේ. සමාජ එක්සත්භාවය නම් රට දේශපාලනික, ආර්ථික හා සමාජීය වශයෙන් සහජීවනයෙන් පිරුණු ඒකාග්‍ර වූ සාධාරණ සමාජයක් බවට පත් කිරීම සහතික කිරීමයි. (MJNCCA, 2012). සන්නිවේදනයෙන් තොරව කණ්ඩායම් හෝ සමාජයන්හි පැවැත්මක් තිබිය නොහැකි බව සන්නිවේදන විශාරදයක් වූ "මහාචාර්ය විල්බල් ශ්‍රාම්" විසින් පෙන්වා දී ඇත. සමස්ත මානව සංහතියේ සබඳතා සියල්ලක්ම ගොඩනැගී ඇත්තේ සන්නිවේදනය තුළිනි.

ජනමාධ්‍යන්නෙහි අර්ථය සරලව විමසා බැලුවහොත් විශාල ග්‍රාහක පිරිසක් සමඟ සන්නිවේදනයේ නියැලීම යන්න කියැවේ. එනම්, ජනමාධ්‍යයන් වූ කලී ඉතා විශාල ප්‍රේක්ෂක පිරිසක් ඇමතීම සඳහා නිර්මාපිත ව ඇත (Shashikala, 2020). "සංහතික සන්නිවේදනය" යනුවෙන්ද හඳුන්වන්නේ එබැවිනි. ජනමාධ්‍ය වාහකය බවට පත් කරගනිමින් විශාල ග්‍රහක පිරිසකට තොරතුරු ලබාදීම ජනමාධ්‍ය මගින් සිදු වේ. ජනමාධ්‍ය ජන සමාජය වටා මෙන්ම ජන සමාජයේ අවශ්‍යතා මත ක්‍රියා කරයි. ජනමාධ්‍ය මගින් ආරම්භක යුගයේදී විශාල ග්‍රාහක ප්‍රමාණයක් යන්න කෙරෙහි අවධානය යොමු කිරීමට වඩා ග්‍රාහක ක්ෂේත්‍රයේ සාමාජික ස්වභාවය පිළිබඳ අවධානය යොමු කිරීමක් දක්නට ලැබේ. එහිදී ජනමාධ්‍ය භාවිත කරන ග්‍රාහක පිරිස පිළිබඳ දැඩි අවධානයක් යොමු කර ඇත. මෙහිදී ජනමාධ්‍ය භාවිතා කරන පිරිස කවර ආකාරයේ ග්‍රහක පිරිසක් ද යන්න කෙරෙහි අවධානය යොමු කළ යුතුය. ඔවුන් අඩු සමාජ සම්බන්ධතා පැවැති තනි තනි වශයෙන් කේවල වශයෙන් ජීවත් වූ කොට්ඨාසයකි. එම කාල වකවානුවේ (20 වන ශත වර්ෂයේ) පැවැති සමාජ ස්වභාවය එනම් මේ කාලයේ සිදු වූ කාර්මීකරණය හා නාගරීකරණය හා නවීකරණයත් සමඟ විසංවිධානය දක්ව තිබූ සමාජයේ ජීවත් වූවන් තනි තනි වශයෙන් ඉලක්ක කර ගනිමින් තම මාධ්‍ය මෙහෙයවීමට එදා ජන සමාජය කටයුතු කරන ලදී. එකල පැවැති සමාජය සාමාජීය සම්බන්ධතා ක්ෂය වෙමින් පැවති යුගයකි. නගරවලට ග්‍රාමීය ජනයා සංක්‍රමණය වීමත් සමඟ ඔවුන්ගේ බැඳීම් දුරස් වන්නට විය. ඒ සමග ඔවුන් සාමූහික වශයෙන් ජීවත් වුවද, පෞද්ගලිකත්වයත් පැවති යුගයක් ලෙස නගරවල ජීවත් වූ ජනයා තුළ විවිධත්වයක් විය. එදා ජනමාධ්‍යවල ඉලක්කගත ග්‍රාහකයන් බවට පත් වූයේ ඉහත සමාජ වපසරිය තුළ ජීවත් වූ පිරිසයි. ඔවුන් තනි තනි වශයෙන් ග්‍රාහකයන් ලෙස හඳුනා ගනිමින් ඔවුන්ගේ භාවයන් තෘප්තිමත් කිරීමට, ඔවුන්ගේ ඕනෑ එපාකම් තෘප්තිමත් කිරීමට එකළ ජනමාධ්‍ය කටයුතු කරන ලදී.

තාක්ෂණය හා විද්‍යාවේ දියුණුවත් සමඟ ජන සන්නිවේදනය දිනෙන් දින දියුණු වේ. අද ලෝකයේ එක් කෙළවරක සිට තවත් කෙළවරකට තොරතුරක් ගලා යාමට ගතවන්නේ තත්පර ගණනකි. එහෙත් ජනමාධ්‍ය බිහිවීමට පෙර මෙම තොරතුරු ගලා

ගියේ මන්දගාමීවය. නමුත් කාලය හා අවකාශය ජය ගැනීමත් සමඟ අද වන විට ලෝකයම විශ්ව ගම්මානයක් බවට පත්ව ඇත. මෙම කාලය හා අවකාශය අතික්‍රමණය කිරීම නැවතුනහොත් ඒ තුළ විශාල පරතරයක් ඇතිවනු ඇත. එසේ වුවහොත් නැවතත් අතීත මානවයාගේ භූමිකාවට වර්තමාන මානවයා ලක් වනු නියතය. මන්දයත් වර්තමානය වන විට ජනමාධ්‍ය හා පුද්ගලයා තනි තනි වශයෙන් මෙන්ම සමාජය වශයෙන් පවත්නා සම්බන්ධතාවය ඉතාමත් සමීප වූවකි. වත්මනයේ ජන මාධ්‍යයෙන් තොරව සමාජයක් පැවතිය නොහැකි තත්වයට පත්ව තිබේ. ජනමාධ්‍ය හා සමාජය අතර ඇත්තේ එතරම් සමීප සම්බන්ධතාවයක් යැයි පැවසීම අතිශයෝක්තියක් නොවේ.

වර්තමානයේ කේවල වශයෙන් මෙන්ම සමාජීය වශයෙන් මාධ්‍ය මත යැපීමක් දැකගත හැකිය. ලෝකයේ සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, බලවේග කවර දිශාවකට ගමන් කළ යුතුද යන්න තීරණය කිරීමේ තරම් ප්‍රබලතාවයක් ජනමාධ්‍ය සතුව පවතී. ජනමාධ්‍ය අපගේ ජීවිතයට කෙතරම් බලපෑමක් කරන්නේ ද යත් අද වන විට අපගේ ජීවිතය ගනු ලබන සරල තීරණ, තෝරා ගැනීම් වල සිට ඉතා වැදගත් සංකීර්ණ තීන්දු තීරණ, තෝරා ගැනීම් පවා සිදු කරන්නේ ජනමාධ්‍ය විසිනි. රටක දේශපාලනය පවා හසුරවනු ලබන්නේ ජනමාධ්‍ය මගිනි. වර්තමානයේ ජනමාධ්‍ය මගින් වෙළෙඳ ව්‍යාපාර හා පාරිභෝගිකයා අතර සම්බන්ධතාවය ඇති කිරීමට ද කටයුතු කරයි.

"මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රයන්" ට අනුව ශ්‍රව්‍ය,දෘශ්‍ය හෝ ලිඛිත මාධ්‍යයන් වශයෙන් හැඳින්වෙන ගුවන් විදුලිය, සිනමාව, රූපවාහිනිය, පුවත්පත්, ග්‍රන්ථ සම්පාදන මාධ්‍ය "ජනමාධ්‍ය" නමින් හඳුන්වයි. (මහේන්ද්‍ර, සන්නිවේදන ශබ්දාකරය") සමාජය තුළ සමාජ එක්සත්භාවය ස්ථාපිත කිරීමේදී ජන මාධ්‍යයට සැලකිය යුතු කාර්යභාරයක් ඇත. බොහෝ රටවල මාධ්‍ය සැලකෙන්නේ ආණ්ඩුවේ මුර බල්ලෙකු ලෙස ක්‍රියා කරන සහ බලයේ සිටින අයට වගකියන සිව්වන බූදලය ලෙස ය. කෙසේ වෙතත්, මාධ්‍යයට ප්‍රවෘත්ති වාර්තා කිරීමට වඩා බොහෝ දේ කළ හැකිය. ප්‍රජාවන් අතර අවබෝධය, සංවාදය ප්‍රවර්ධනය කිරීමෙන් සාමය සහ එක්සත්භාවය සඳහා එය ප්‍රබල බලවේගයක් විය හැකිය.

ජන සන්නිවේදන විද්‍යාර්ථයෙන් හඳුනා ගෙන ඇති ආකාරයට ජනමාධ්‍ය මගින් සිදුවන ප්‍රධාන කාර්යයන් ගණනාවකි. එහිදී තොරතුරු සම්පාදනය, උපදෙස් සම්පාදනය, පෙළඹවීම, විනෝදාස්වාද සම්පාදනය, සුපරීක්ෂණය, සමාජ ප්‍රතිසංවිධානමය කාර්ය, සංස්කෘතිය පවරාදීම, තොරතුරු අර්ථකථනය, සමාජානුයෝජනය, මතවාදී කාර්යය යනාදී කාරයන් රැසක් ජනමාධ්‍ය මගින් සිදු කරන කාර්යභාරයන් ලෙස හඳුනාගෙන ඇත. මේ කාර්යයන් අතරින් තොරතුරු සම්පාදනය, පෙළඹවීම, සංස්කෘතිය පවරාදීම, තොරතුරු අර්ථකථනය, මතවාදී කාර්යය යන කාර්යයන්වලදී ජනමාධ්‍යයට සැලකිය යුතු ප්‍රමාණයකින් සමාජ එක්සත්භාවය සඳහා ක්‍රියා කළ හැකිය.

සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම ජනමාධ්‍යයෙන් කෙරෙන ප්‍රධාන කාර්යයකි. සෑම ජාතියකටම, සෑම ජන කොට්ඨාසයකටම තමන්ට අනන්‍ය වූ සංස්කෘතියක් තිබේ. එය බාහිර සංස්කෘතියෙන් සමඟ ගැටී පෝෂණය වීම නිරතුරුවම සිදුවන්නකි. ජාතියක් හෝ ජන කොට්ඨාසයක හෝ සංස්කෘතිය හඳුනාගැනීම, ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය සඳහා ජනමාධ්‍ය දායක විය යුතුය. විවිධත්වය සමඟ ඒකත්වය පවත්වා ගැනීම සඳහා සංස්කෘතිය ප්‍රවර්ධනය අත්‍යවශ්‍ය සාධකයකි. එසේම සංස්කෘතියේම උරුමයන් පරම්පරාවෙන් පරම්පරාවට පවරාදීම ද අතීතය හා වර්තමානය අතර සබඳතාවයක් ඇති කිරීමද සිදුවේ. මෙම සංස්කෘතික කාර්ය තුළ ජනමාධ්‍ය නිරන්තරයෙන් කටයුතු කළ යුත්තේ සමාජ එක්සත්භාවය කෙරෙහි අවධානය යොමු කරමිනි.

Lasswell (1948) ට අනුව, ජනමාධ්‍යයේ ප්‍රධාන කාර්යයන් වන්නේ සමාජ පරිසරය නිරීක්ෂණය කිරීමයි. පුද්ගලයින් පරිසරයට ප්‍රතිචාර දැක්වීම් කළ යුතු ආකාරය සහ සංස්කෘතික උරුමයන් ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳව ජනමාධ්‍ය මගින් තොරතුරු මුදා හරී. ඒ අනුව සමාජය එක්සත් කිරීමට අදාළ වැදගත් කාර්යභාරයක් ජනමාධ්‍යන්ට තිබේ.

සමාජය තුළ විවිධ මතවාද ඇතිවීම සමාජයක පැවැත්මට හේතු වේ. එසේම සමාජයේ සිදුවන අලුත් තත්ත්වයන් පිළිබඳ දැනුවත් කර මතවාද ගොඩනගා එම මත ක්‍රියාත්මක කරන තත්ත්වයකට ජනතාව රැගෙන ඒමේ කාර්ය ජනමාධ්‍ය මගින් ඉටුවේ. එය අසමගිය සඳහා නොව මතවාද ගැටීම ඔස්සේ වඩාත් හොඳම මතයට ඉඩකඩ ලැබීමට අවකාශය පවතින බැවිනි. ආගමික, දේශපාලනික, ආර්ථික, සංස්කෘතික ආදී විවිධ ක්ෂේත්‍රවල මතුවන මතවාද පෝෂණය වන්නේත්, ව්‍යාප්ත වන්නේත් ජනමාධ්‍ය මගිනි. සමාජය පවත්නා වූ විවිධ මත සාකච්ඡාවට හා විවාදයට භාජනය කිරීමෙන් වඩාත් නිවැරදි අදහස මතු කර ගැනීමට උපකාරී වේ. සෑම දෘෂ්ටියක්ම, සෑම වචනයක්ම, සෑම තර්කයක්ම සාකච්ඡා කළ යුතුය. කණ්ඩනය කළ යුතුය. විශ්ලේෂණය කළ යුතුය. ඉන් උපත ලබන නිවැරදි හෝ වැඩිම පිරිස පිළිගන්නා හෝ මතය ප්‍රතිපත්ති සම්පාදනයේදී ගුරුකොට ගත යුතුය. නූතන මහා සමාජවල වැඩිම පිරිසක් සහභාගී කරගනිමින් මේ විවාදය හා සාකච්ඡාව මෙහෙයවිය හැක්කේ ජනමාධ්‍ය මගිනි.

කිසියම් සමාජයක් නිශ්චිත රටාවක් යටතේ සංවිධානය කිරීම නැතහොත් එකම අරමුණකට සමාජ එකතු කිරීම සමාජ සංවිධානමය කාර්යයි. සාමය, ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ ප්‍රතිසංවිධානය, නවීකරණය වැනි අරමුණු වෙනුවෙන් සන්නිවේදනය ඔස්සේ සමාජ ප්‍රතිසංවිධානමය කාර්ය ජනමාධ්‍ය මගින් ඉටු කරනු ලබයි. එය සමාජ එක්සත්භාවයට හේතු වේ.

නූතන ගෝලීය සමාජය නිර්මාණය වී තිබෙන්නේ විවිධ ජාතීන් ජනවර්ග හා කණ්ඩායම් එක්වීමෙනි. ඔවුහු විවිධ භාෂා කතා කරති. වත්මන් ලෝකයේ භාවිත භාෂා සංඛ්‍යාව 7000 පමණ වේ. ඔවුහු විවිධ ආගම් අදහති. ඔවුන්ගේ සංස්කෘතික

චාර්යාවන් අතර වෙනස්කම් පවතී. එහෙත් ඔහු සියල්ලෝම එකම මිනිස් පවුලේ සාමාජිකයෝ වෙති. රටක් ඇතුළත වුවද මේ විවිධත්වය දැකිය හැකි ය. එසේ විවිධ වූ ජන කණ්ඩායම් අතර අන්‍යෝන්‍ය අවබෝධය, සහජීවනය අන්‍යෝන්‍ය ගෞරවය ඇති කිරීම අනුකලනයෙන් අදහස් වේ. මේ අනුව ජනමාධ්‍ය සතු මෙකී කාර්යය තුළ සමාජ එක්සත්භාවය අර්ථවත් වේ.

සමාජයක් තුළ සිටින මෙම සියලු කොටස් ජාතිය, කුලය, ධනය, බලය, වත්කම ආදී තත්ත්වයන්ගෙන් විවිධ ය. මේ කුමන පිරිස වුවද, එකම අයිතිවාසිකම් පද්ධතියක් තුළ සහජීවනය අගයමින් දිවි ගෙවන්නට හැකි නම් එතන එක්සත්භාවයක් ගොඩනැගේ. ශ්‍රී ලාංකික සමාජය තුළ ප්‍රධාන වශයෙන් සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් යන සෑම ජන කොටසක්ම හැසිරීම්, ආකල්ප, ඇදහීම්, ආදියෙන් වෙනස් වුවද, එක්සත් ශ්‍රී ලාංකික ජාතියක් ලෙස ඉදිරියට යාමට නම් රටේ පාලක පිරිසකගේ ජාතික පණිවුඩ පොදු විය යුතුය, එනම් එක්සත් බව ගොඩනැගීමට රටේ ප්‍රධාන කොටස් යොමු කරන පණිවුඩ බලපායි. ප්‍රධාන වශයෙන් මේ පාලන බලය දරන්නන් සමාජය වෙත පණිවුඩ මුදා හරිනු ලබන ප්‍රධාන වාහකය ජනමාධ්‍යයි. එහෙයිනි සමාජයක් එක්සත්භාවය සහතික කිරීමේදී ජනමාධ්‍යයේ ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් හේතු වේ.

ඕනෑම කෙනෙකුහට තම ආගම ඇදහීම, භාෂාව කතා කිරිමේ කිසිදු ගැටළුවක් නැත. එය එසේ සිදු වන විට ජාතිකත්වය වෙනුවෙන්, ජාතික අභිලාශය වෙනුවෙන් සැවොම එකතු වේ. උප්පැන්න සහතිකයේ පවතින ශ්‍රී ලංකික යන යෙදුම සදා තිරසාරත්වයට පත්වන්නේ එවිටයි. සෑම ආගමකටම ගෞරව කිරීමේ ශක්තිය සැමට තිබිය යුතුය. මෙම ගුණ ජනතාව අතර නිරන්තරයෙන් වගා කිරීමේ කාර්යය ජනමාධ්‍ය සිදුකරන්නේ නම් සමාජ එක්සත්භාවය සහතික වේ. මනා කළමණාකරණයකින් යුතුව ගැටුම් මැඩලීම, හිත් සුවපත් බව පෙන්වන දයාව, කරුණාව, ඉවසීම, සත්‍යවාදී බව, සතුට, සාධාරණ බව, සහවේදනය, බෙදා හදා ගැනීම, සංවේදී බව ආදීය ගොඩනැගීමට ජනමාධ්‍ය ක්‍රියා කළ යුතුය.

නෙල්සන් මැන්ඩෙලාට" අනුව, එක්සත්භාවය යනු ජාතිය, වර්ණය, ආගම, ස්ත්‍රී පුරුෂ භාවය, පංතිය, කුලය හෝ වෙනත් සමාජ සලකුණු නොසලකා සැමට සමෘද්ධිමත් විය හැකි පරිසරයක් නිර්මාණය කිරීමයි." සමාජයන් තුළ එක්සත්භාවය ප්‍රවර්ධනය කිරීමේදී මාධ්‍යයට තීරණාත්මක කාර්යභාරයක් ඇත.

- විවිධ හඬවල් සඳහා වේදිකාවක් සැපයීම,
- ධනාත්මක කථා ඉස්මතු කිරීම,
- සංවාද සහ විවාද ප්‍රවර්ධනය කිරීම
- පුවත්පත් කලාවේ ඉහළම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම

යනාදිය මගින් විවිධ කණ්ඩායම් අතර අවබෝධය, ඉවසීම සහ සහයෝගීතාව වර්ධනය කිරීමට ජනමාධ්‍යයට උපකාර කළ හැකිය. මෙම බලය වගකීමෙන් හා ඵලදායි ලෙස භාවිතා කරමින් වඩාත් සාමකාමී සහ සුහද ලෝකයක් සඳහා වැඩ කිරීම ජනමාධ්‍යයේ කාර්යයකි.

සෑම ජනමාර්ගයකටමත් අවැසි දෑ හඬ නගා පැවසීමට ජනමාධ්‍ය ඉඩහසර ලබා දීම සමාජ එක්සත්භාවයට පිටුවහලකි. සමාජය විවිධ කාරණා සම්බන්ධයෙන් තරගකාරී අදහස් හා පරස්පර විරෝධී අදහස් දරයි. මෙම අසමාන හා පරස්පර අදහස් එකම මතයක් බවට පත්කිරීමේ හැකියාව ජනමාධ්‍ය හට පවතී. මෙම බාධක බිඳ දැමීමට පොදු අරමුණු හා හවුල් වටිනාකම් පිළිබඳ තැකීමක් ඇති කිරීමට ජනමාධ්‍ය උපකාරී වේ. විශේෂයෙන් රූපවාහිනී මාධ්‍ය මානව සංජානනය (Perception) වෙනස් කිරීමට සමත් වන අතරම එය රටක හෝ සමාජයක ආර්ථික සමාජ සංස්කෘතික ක්‍රියාවලියෙහි ප්‍රතිබිම්බය බවට ද පත් වේ. එමෙන්ම එය පුද්ගලයාට සමාජ අනුවර්තනීය දිශාව ද පෙන්වා දෙනු ලබයි (Muhammad Nasir, 2013).

ජනමාධ්‍යයට සමාජ එක්සත්භාවය ප්‍රවර්ධනය කළ හැකි තවත් ක්‍රමයක් නම් ධනාත්මක කථා ඉස්මතු කිරීමයි. විවිධ කොටස් අතර ගැටුම් ඇති කරවන ඍණාත්මක සිදුවීම් කෙරෙහි ජනමාධ්‍ය නිරන්තර අවධානය යොමු වේ. එහෙත් එවැනි අවස්ථාවලදී මාධ්‍ය සදාචාර සම්පන්නව සමාජ ගැටුම් විසඳා ගැනීමට මග පෙන්වන අයුරින් ජනමාධ්‍ය කටයුතු කරන්නේ නම් වටී. එවිට කණ්ඩායම් අවිශ්වාසය පසෙකලා සාමූහික ක්‍රියාකාරකම් පිළිබඳ හැඟීමක් ප්‍රවර්ධනය කළ හැකි ධනාත්මක කතා ඉස්මතු කරන්නේ නම් ජනමාධ්‍ය මගින් සමාජ එක්සත්භාවය සහතික වේ.

මීට අමතරව, සංවාදය සහ විවාදය ප්‍රවර්ධනය කිරීමේදී මාධ්‍යයට කාර්යභාරයක් ඉටු කළ හැකිය. විවෘත හා අවංක සංවාදයක් සඳහා අවකාශයක් ලබා දීමෙන්, ජන කොටස්හි මතය සමස්ත ජනයා අතර ප්‍රචලිත වේ. එහෙත් එහිදී ප්‍රජාවන් අතර පාලමක් ගොඩනැගෙන අයුරින් ජනමාධ්‍ය ක්‍රියා කළ යුතුය. මේ සඳහා ජනමාධ්‍ය මගින් ආධ්‍යාත්මික ගුණ වගා කිරීමේ වැඩසටහන් හා මනෝවිද්‍යාත්මක වැඩසටහන් දියත් කරයි. ජනමාධ්‍යයේ ප්‍රධාන කාර්යයන් වන මතවාදී කාර්යය සමඟ මෙය ඇඳේ. නමුත් මෙහිදී ඉහළ සිට පහළටත්, පහළ සිට ඉහළටත් මනා අන්තර් සබඳතාවක් හරහා සමීපතාවක් ගොඩනගා ගැනීමට තරම් වන බලයක් එම වැඩසටහන් තුළ තිබිය යුතුය. කෙසේ වෙතත්, මෙම මහා බලය සමඟ විශාල වගකීමක් ඇත. මාධ්‍ය මෙම වැඩසටහන් නිවැරදිව, සාධාරණව සහ වගකීමෙන් වාර්තා කිරීමට අපොහොසත් වුවහොත් එයින් ඇති විය හැකි හානිය ගැන ද අවධානයෙන් සිටිය යුතුය. වැරදි තොරතුරු සහ අසත්‍ය ප්‍රවෘත්ති ගැටුම් අවුළුවා බෙදීම් ඇති කළ හැකි බැවින් මාධ්‍යවේදයේ ඉහළම ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට මාධ්‍ය අවධානයෙන් සිටිය යුතුය.

තවද, මාධ්‍ය වෘත්තිකයින් වගකිව යුතු වෘත්තීය පුවත්පත කලාවේ නිරත විය යුතුය. එය වෛෂයික, නිවැරදි සහ සියලු පාර්ශව කරුවන්ට සාධාරණ ආකාරයෙන් පණිවුඩ සමාජගත කළ යුතුය. එවිට ජනමාධ්‍ය ද සමාජ එක්සත්භාවයේ මෙවලමක් බවට පත් වේ (McQuail, 2010). ජාතික, නගර සහ ප්‍රාදේශීය විසිරී සිටින පුද්ගලයන් සම්බන්ධ කිරීමට ජන මාධ්‍ය සමත් වන බැවින් නව ආකාරයේ විභව බලවේගයක් බව McQuail සඳහන් කළේය. කලකෝලාහල ඇතිවීමට ඉඩ ඇති අවස්ථා පිළිබඳව කල්තියා ප්‍රචාරයක් ලබා දීමෙන්, කැරලි කෝලාහල හැසිරීමට හේතු වනසිද්ධීන්

ප්‍රකාශයට පත් කිරීමෙන්, සමාජ එක්සතිභාවයට හානි සිදු විය හැකි අවස්ථා වලක්වා ගැනීමට ජනමාධ්‍යය විචක්ෂණශීලී විය යුතුය (Singer; 1970).

ජනමාධ්‍ය ප්‍රාදේශීය මට්ටමින් සමාජ සහජීවන මාර්ගෝපදේශක සාධකයක් විය යුතුය. ඒ හරහා ප්‍රජාවන්ට දේශපාලන, ආර්ථික සහ සමාජීය ප්‍රශ්නවල පැතිකඩ ආරවුලකින් තොරව පවත්වා ගැනීමට ක්‍රියා කළ යුතු අතර, පොදු දැක්මකින් ජන මාධ්‍ය ක්‍රියා කිරීම වටී. එබැවින්, සංවර්ධන වැඩසටහන් දියත් කිරීමේදී ද ප්‍රදේශයේ ප්‍රජාවන් සාමයෙන් සහ සහජීවනයෙන් එකට ජීවත් වනු අයුරින් පණිවුඩ මුදා හැරීම කළ යුතුය. ජනවාර්ගික කණ්ඩායම්, සංස්කෘතීන් සහ විශ්වාස පද්ධති අනුව ඔවුන්ගේ විවිධත්වය අගය කිරීමට සහ සැමරීමට ඔවුන්ට මග පෙන්වීම කළ යුතුය. එබැවින් සමාජ එක්සත්භාවය සාක්ෂාත් කර ගැනීමේදී මාධ්‍ය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ හැකිය.

විශේෂයෙන් ජන මාධ්‍ය මහජනතාව සඳහා න්‍යාය පත්‍රය සැකසීමට භාවිත කළ හැකි ප්‍රබල සන්නිවේදන මෙවලමකි. ජනමාධ්‍යයට සමාජය මර්දනය කිරීමට මෙන්ම නිදහස් කිරීමටද, එක්සත් කිරීමට මෙන්ම ඛණ්ඩනය කිරීමටද, වෙනසක් ඇති කිරීමට මෙන්ම වළක්වා ගැනීමටද සේවය කළ හැකිය. එනම් ජනමාධ්‍ය සතුව වැඩසටහනෙහි අන්තර්ගතය පොදු විය යුතුය. සෑම ජන කණ්ඩායමකටම එකම අන්තර්ගතයක් ඉදිරිපත් කරන්නේ නම් වටී. එනම් වෛරී පණිවිඩ සහ කටකතාවලට මායිම්ව අන්තර්ගත ප්‍රකාශනය හෝ විකාශනය කිරීමෙන් වැළකී සමාජ ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීමට සමත් විය යුතුය. ප්‍රජාවන් අතර පාලමක් ගොඩනැගෙන අයුරින් ජනමාධ්‍ය ක්‍රියා කළ යුතුය.

නමුත් වත්මනයේ රජය සතු ජන මාධ්‍ය බොහෝමයක් තම දේශපාලන පැවැත්ම සඳහා සදාචාරාත්මක සමාජ එක්සත්භාවය ඇති කිරීම වෙනුවෙන් කටයුතු කරනු දක්නට නොලැබේ. නිදහසින් පසුවත්, සහජීවන ජාතියක් ගොඩනැගීමට වැඩි යමක් සිදු වී නැත. රටේ ජාතික සහජීවනය සහ ඒකාග්‍රතාවය පිළිබඳ තැකීමක් දක්නට නොලැබේ.

මැතිවරණවලදී අන්තර් වාර්ගික ගැටුම් පිළිබඳ ගැටළු බොහොමයක් ඇති කළ බවට ජනමාධ්‍ය හට දෝෂාරෝපණ සිදු වේ. ජනමාධ්‍යයට, සහජීවනයෙන් යුත් ජාතියක් ගොඩනැගීම සඳහා දේශපාලන මත ඉවසීම, සාමය සහ සංවාදය පිළිබඳ පණිවිඩ යෝජනා කළ හැකිය. මීට අමතරව, උණුසුම් ස්ථාන සහ ගැටුම් බහුල කලාප ලෙස සැලකෙන ප්‍රදේශවල සාමය සහ ස්ථාවරත්වය පෝෂණය කිරීමේ වගකීම මාධ්‍යයට ගත යුතුය.

මහජන මතය සහ හැසිරීම් සැකසීමේදී මාධ්‍ය බලපෑම් කරයි. නිදසුනක් වශයෙන්, පළමු ලෝක සංග්‍රාමයේදී එක්සත් ජනපදය සහ අනෙකුත් යුරෝපීය රටවල් සටන් කිරීමට ජනතාව බලමුලු ගැන්වීම සඳහා පුවත්පත් සහ චිත්‍රපට හේතු විය. මාධ්‍ය ජාත්‍යන්තර සබඳතා සහ සන්ධාන කෙරෙහි ද බලපෑම් ඇති කරයි. මෑතදී,

කොමියුනිස්ට්වාදයේ වැටීම, බෝල්කන් යුද්ධ, ගල්ෆ් යුද්ධ දෙකක් සහ ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය මහජන මතය ද සාධකයක් වන ඕනෑම ජාත්‍යන්තර බල අරගලයක අත්‍යවශ්‍ය සහ වාෂ්පශීලී සංරචකයක් ලෙස මාධ්‍ය ක්‍රියා කර ඇත (McQuail, 2010). එහෙත් ජනමාධ්‍ය මෙකී සමාජ එක්සත්භාවයට තර්ජනයක් වන වාර්ගික ප්‍රවේශයන්ට නැඹුරු නොවී සමාජ එක්සත්භාවයේ මෙවලමක් ලෙස ක්‍රියා කළ යුතුය.

එහෙත් දැන් දැන් තත්කාලීන සමාජයේ සමාජ එක්සත්භාවය වනාශ කිරීම සඳහා ජනමාධ්‍ය හේතු වන බවක් දැකිය හැකිය. වෘත්තීයභාවයකින් තොරව සිදු වන ජනමාධ්‍ය නිෂ්පාදන පුද්ගලයාට, සමාජ සංවිධානවලට සහ සමස්ත සමාජයට ප්‍රබල ගැටලු නිර්මාණය කරයි. ජනමාධ්‍යයෙන් වක්‍රව උගන්වන්නේ යහපත් සංවර්ධන මාවත වෙනුවට ගැටුම් ඇති වීමට අදාල මංපතයි. ටෙලි නාට්‍ය ඊටහොඳම සාක්ෂියකි. ජනතාවට වැඩිම අවධානයක් ඇති මාධ්‍ය ක්ෂේත්‍රය යහ අතට පරිවර්තනය නොකර කොතරම් සංහිඳියා, සහජීවන ක්‍රමවේද නිර්මාණය කලත් ඉන් ඵලක් උදා වන්නේ නැත. වෛරය, ඊර්ෂ්‍යාව, පලි ගැනීම, ආදී අසම්මතයන්ගෙන් පිරීපවතින මාධ්‍ය සංදේශ නිසා කුඩා අවධියේ සිට මනස විකෘති වීමට පටන් ගනී. වැඩිහිටි පරම්පරාව ඉදිරිපත්ව බාල පරපුරට සත්‍ය වටහා දීමට උත්සහා කළ ද ඔවුන්ගේ උපදෙස් අනුශාසනා පිළිගන්නා ප්‍රමාණය ඉතා අඩුය. පරිගණකය අසල, රූපවාහිනිය අසල නිතර මනස නතර කරන දරුවා මනස වැඩෙන හොඳම කාලයේ එහි පුරවා ගන්නේ දිවියට අවැසි දෑ නොවන තත්වයක් ඇත. ඒ තුළින් සමාජ එක්සත්භාවය වෙනුවට සමාජ වෛරය, පුද්ගල සහ සමාජ සංවිධානයන්හි ගරුත්වය (Reputation), සමාජ ආර්ථිකබිඳ දැමීම් ද සිදු කරයි. යම් රටක හෝ සමාජයක සමාජ වගකීම් රහිත ජනමාධ්‍ය පවතින විට ජනතාව රැක ගැනීමේ අරමුණින් මාධ්‍ය අන්තර්ගතයන් ඉදිරියට පැමිණෙන බැව් නොපෙනේ. වර්තමානයේ පවතින දූෂණ, වංචා, මිනී මැරුම් ආදී සමාජ එක්සත්භාවය සිඳ දමන තත්ව මතුවන්නේත්, ගෘහස්ථ හිංසනය වැඩිවන්නේත් මුලින් කී කරුණු පිරුණු අසම්මත ජනමාධ්‍ය සමාජයක් නිර්මාණය වී ඇති බැවිණි.

නව මාධ්‍ය භාවිතය හරහා ජන මාධ්‍ය සුසර කිරීමේ හැකියාව ඉතිහාසයට වඩා වේගයෙන් වර්ධනය වී තිබේ. ඒ වර්ධනයේ වේගවත් ස්වරූපයට සාපේක්ෂ ලෙසින්ම සමාජයේ තිබෙන ඒ හා සබැඳෙන ගැටලුවල වැඩි වීමද ජනමාධ්‍ය හේතු වී තිබේ. විශේෂයෙන්ම පවුල බිඳ වැටීමේ කාරණාව, මිනිසා හුදකලා වීමේ කාරණාව, ඒ වගේම මිනිසා තුළ ආත්මාර්ථයක් ගොඩනගා නැගීමේ කාරණාව, පරාර්ථකාමය ගිලිහීමේ කාරණාව, සරල මානසිකත්වයක් ගොඩනගා නැගීමේකාරණාව වැනි බහුවිද ප්‍රශ්න පුද්ගල කේන්ද්‍රීයව ගොඩනැගෙන ආකාරයක් ගොඩ නැගී තිබේ. තත්කාලීන සමාජයේ සමාජ එක්සත්භාවය විනාශ කිරීම සඳහා ජනමාධ්‍ය හේතු වන බවක් දැකිය හැකිය. ජන මාධ්‍ය ආචාර ධර්මවලට අනුව නම්,

1.සත්‍යවාදී බව - Truth Telling
2.නිදහස - Independence
3.හානිය අවමකිරීම - Minimizing Harm
4.වගකිව යුතු බව - Accountability

යන මූලධර්ම මත ජනමාධ්‍ය පණිවුඩ රැගෙන යා යුතුය. එවිට, සමාජ එක්සත්භාවය සහතික කිරීම උදෙසා ද මංපෙත් තැනේ.

ජනමාධ්‍ය ආචාරධර්ම පිළිබඳව සලකා බැලීමේදී ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය විසින් 2008 වර්ෂයේදී හඳුන්වා දෙන ලද ජාතික මාධ්‍යය ප්‍රතිපත්තියේ සඳහන් කරුණු කෙරෙහි ද අවධානය යොමු කළ හැකිය. වගන්ති 15 කින් සමන්විත එම ප්‍රතිපත්තිමාලාව පහත සඳහන් පරිදි හඳුනාගත හැකිය.

- මාධ්‍යය නිදහස හා තොරතුරු වලට ප්‍රවේශය සඳහා ඇති අයිතිය
- ජාතික හා සාමාජීය වගකීම
- මාධ්‍යය සංවර්ධනය
- පිළිතුරු දීමේ අයිතිය
- වගවීම්
- දැන්වීම්කරණය හා ප්‍රචාරය
- භාෂා භාවිතය
- පුහුණු, පර්යේෂණ හා හැකියා ප්‍රවර්ධනය
- කර්තෘ මණ්ඩල ස්වාධීනභාවය
- මාධ්‍යවේදීන්ගේ අයිතිවාසිකම්
- පුද්ගලිකභාවය
- අන්තර් ජාතික සම්බන්ධතා
- අපරාධ හා හිංසනය
- ළමා අයිතීන්
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය

මේ තුළ මාධ්‍යය නිදහස හා තොරතුරු වලට ප්‍රවේශය සඳහා ඇති අයිතිය, ජාතික හා සාමාජීය වගකීම්, වගවීම්, මාධ්‍යවේදීන්ගේ අයිතිවාසිකම්, අපරාධ හා හිංසනය යනාදිය මගින් සමාජ එක්සත්භාවය සහතික කිරීමට අදාල කාර්යයභාරයක් මාධ්‍යන්හට වක්‍රව පැවරේ. එහෙයින් සමාජ එක්සත්භාවය සහතික කිරීමේදී ජනමාධ්‍යහට තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ හැකිය. එනම්, ඔවුන් දෙබිඩි කඩුවකි. සමාජ ඒකාබද්ධතාවයට සහය දැක්වීමට මෙන්ම යටපත් කිරීමටද ජනමාධ්‍යයට හැකියාව ඇත.

**පර්යේෂණ ගැටලුව**

ජනමාධ්‍ය සමාජය තුළ සීඝ්‍ර වශයෙන් ප්‍රචලිත වීමත් සමග එය සමාජයේ ප්‍රධාන භාවිත මෙවලම් කට්ටලයක් ලෙසින් දැක ගත හැකිය. ජන සන්නිවේදන විද්‍යාර්ථයෙන් ජනමාධ්‍යයන්ගෙන් සිදුවේ යැයි ප්‍රධාන වශයෙන් පිළිගන්නා කෘත්‍යාත්මක කාර්යභාරයක් ඇත. එකී කාර්යය තුළ "සමාජ එක්සත් භාවය සහතික කිරීමේදී ජනමාධ්‍ය සිදු කරනු ලබන කාර්යය" පිළිබඳ විමර්ශනය කළ යුතුය. ඒ අනුව "සමාජ එක්සත් භාවය සහතික කිරීමේදී ජනමාධ්‍යයේ කාර්යභාරය කෙබඳුදැයි යන්න සොයා බැලීම" පර්යේෂණය කිරීමට විවර වන ප්‍රධාන ගැටළුවයි.

**උපකල්පනය**

සමාජයක සත්භාවය සහතික කිරීමේදී ජනමාධ්‍ය සැලකිය යුතු කාර්යභාරයක් සිදු කරනු ලබයි.

**පර්යේෂණයේ අරමුණු**

ප්‍රධාන අරමුණ: සමාජයෙක් එක්සත්භාවය සහතික කිරීමේදී ජනමාධ්‍යයක් කාර්යභාරය කෙබඳුදැයි සොයා බැලීම.

උප අරමුණු:

- තත්කාලීන සමාජය තුළ භාවිත කෙරෙන ජනමාධ්‍ය හඳුනා ගැනීම.
- සමාජ එක්සත් භාවය යන්නෙන් ඉදිරිපත් කර ඇති අදහස් හඳුනා ගැනීම.
- සමාජයක් එක්සත්භාවය සහතික කිරීමේදී ජනමාධ්‍ය තුළින් කෙරෙන කාර්යයන් සොයා බැලීම.
- සමාජයක් එක්සත්භාවය සහතික කිරීම සඳහා ජනමාධ්‍ය තුළින් කෙරෙන කාර්යය පිළිබඳ තරුණ සිසු පිළිගැනීම අධ්‍යයනය කිරීම.
- ඒ අනුව තත්කාලීන ශ්‍රී ලාංකීය සමාජය තුළ, සමාජ එක්සත්භාවය සහතික කිරීමේදී ජනමාධ්‍ය කාර්යයභාරයේ ස්වභාවය අධ්‍යයනය කිරීම.

**සාහිත්‍ය විමර්ශනය**

දකුණු අප්‍රිකාවේ "Adebimpe Esther Ofusori" විසින් "The role of the media in promoting social cohesion in South Afric" නමින් සිදු කරන ලද පර්යේෂණ ලිපිය සාහිත්‍ය විමර්ෂණයෙහිලා ඉතා වැදගත් වේ. මෙම ලිපියට අනුව, සමාජ සහජීවනය යනු සමාජයක් හෝ ප්‍රජාවක් තුළ එකමුතුකම, ඒකාග්‍රතාවය සහ සහජීවනයේ ප්‍රමාණයයි. එය පුද්ගලයන් හෝ කණ්ඩායම් අතර විශ්වාසය ප්‍රවර්ධනය කරයි. යහපත් සබඳතාවයක් සහ බැඳීම් ඇති කරයි. සමාජයක ස්ථාවරත්වය, සමෘද්ධිය සහ සුවපහසුව පවත්වා ගැනීමට එය උපකාර වන බැවින් සමාජ ඒකාබද්ධතාවයේ වැදගත්කම අවතක්සේරු කළ නොහැක. දකුණු අප්‍රිකාවේ, සමාජ සහජීවනය වඩාත් මුහුණ දෙන අභියෝගවලින් එකක්ම බව දක්වයි. බොහෝ දකුණු අප්‍රිකානුවන් තවමත් පන්තිය, ජාතිය සහ වාර්ගිකත්වය වැනි පොදු අනන්‍යතාවලිනි වෙන්ව සිටී. වර්ණභේදවාදී පාලන තන්ත්‍රය අවසන් වී නිදහස ලැබීමෙන් පසු දකුණු අප්‍රිකාව ආණ්ඩුවේ මැදිහත්වීම් නොතකා සමාජීය වශයෙන් ඒකාබද්ධ ජාතියක් වී නොමැත. ඒ වෙනුවට, වාර්ගික හා සමාජ බෙදීම් පැවතිණි. දකුණු අප්‍රිකාවේ ජනමාධ්‍ය මෙම හිඩැස් මඟහරවා ගැනීමට සහ වඩාත් ඒකාබද්ධ හා ඇතුළත් සමාජයක් පෝෂණය කිරීමට තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. දකුණු අප්‍රිකානු මාධ්‍ය මුද්‍රණ මාධ්‍ය, විකාශන මාධ්‍ය, මහජනතාව සඳහා තොරතුරු සහ ප්‍රබුද්ධත්වයේ ප්‍රාථමික මූලාශ්‍රයක් ලෙස ක්‍රියා කරයි, විවෘත විවාදයකට ඉඩක් සලසා දෙයි. ජාතිය, සංස්කෘතිය, දේශපාලනය සහ සමාජ සාධාරණත්වය සම්බන්ධ ගැටළු පිළිබඳව නිවැරදි හා සමබර වාර්තාකරණයක් ලබා දීමෙන්, මාධ්‍ය මගින් පුරවැසියන්ට තම සමාජයේ සංකීර්ණතා අවබෝධ කර ගැනීමට සහ සමාජ ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීමට උපකාර කළ

හැකිය. මෙම ලිපියෙන් සමාජ එක්සත්භාවය ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය ප්‍රධාන අංග ඉදිරිපත් කරයි.

විශ්වාසය සහ සමාජ ප්‍රාග්ධනය, හවුල් වටිනාකම් සහ අනන්‍යතාවය, විවිධත්වය, ආර්ථික සමානාත්මතාවය, ගුණාත්මක අධ්‍යාපනයට සමාන ප්‍රවේශය, දේශපාලන ස්ථාවරත්වය ,සමාජ සේවා සහ සුබසාධනය, ක්‍රියාකාරී සහභාගීත්වය යන ගුණාංග දක්වන අතර දකුණු අප්‍රිකාවේ සමාජ සහජීවනය ප්‍රවර්ධනය කිරීමේ මාධ්‍ය භූමිකාව ලෙස, නිවැරදි තොරතුරු සැපයීම, භාෂා විවිධත්වය, විවිධ නියෝජනය, සංවාදය සහ විවාදය ප්‍රවර්ධනය කිරීම, සමාජ සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටීම, ප්‍රජා සහභාගීත්වය, ජාතිය ගොඩනැගීමේ මුලපිරීම්වලට ප්‍රමුඛත්වය දීම, අර්බුද වාර්තා කිරීම සහ ගැටුම් නිරාකරණය සිදු කරන බව දක්වයි.

අවසාන වශයෙන්, සමාජ ඒකාබද්ධතාවය ස්ථිතික නොවන බවත් විවිධ සමාජ, ආර්ථික සහ දේශපාලන සාධකවලට ප්‍රතිචාරත් සමඟ එය වෙනස් විය හැකි බව දක්වයි. මාධ්‍ය වගකීමෙන් සහ සදාචාරාත්මකව භාවිතා කරන විට, එය හිඩැස් නැති කිරීමට සහ වඩාත් ඒකාබද්ධ සමාජයක් ගොඩනැගීමට ප්‍රබල මෙවලමක් විය හැකි බව දක්වයි. කෙසේ වෙතත්, මාධ්‍ය පමණක් වගකීම දැරිය යුතු නැති බවත් සමාජයේ සෑම අංශයකින්ම සහයෝගීතාවය සහ කැපවීම යන අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී තීරණාත්මක විය යුතු බව දක්වයි. එසේම, රට තුළ ශක්තිමත් සමාජ බැඳීම් සහ සමගිය පිළිබඳ හැඟීමක් ගොඩනැගීමට සහ පවත්වා ගැනීමට රජයන්, ප්‍රජාවන් සහ පුද්ගලයන්ගේ අවධානය සහ උත්සාහය අවශ්‍ය වන බව ලිපියෙන් දක්වයි.

මෙම අධ්‍යයනය සම්බන්ධයෙන් හමු වූ ඉතාමත් වැදගත් අධ්‍යනයක් වන්නේ "2007" වර්ෂයෙදී ඔස්ටේලියාවේ "Andrew Jakbowicz" විසින් The Media and Social Cohesion" නමින් සිදු කරන ලද පර්යේෂණයයි. ඔහුගේ පර්යේෂණ ලිපියට අනුව, සමාජ එක්සත්භාවය සාකච්ඡා කළ හැකි සහ අත්විඳිය හැකි එක් ස්ථානයක් ඇත. සමකාලීන සමාජයේ බොහෝ සමාජ කණ්ඩායම් අතර විචක්ෂණශීලී මැදිහත්වීම් සඳහා අවස්ථා ලබා දිය හැක්කේ "පොදු ක්ෂේත්‍රයක්" තුළය. (Habermas 1989). පොදු ක්ෂේත්‍රය අර්ධ වශයෙන් පිහිටුවා ඇත්තේ ජන මාධ්‍ය හරහා වන අතර, ඒවායේ විවිධත්වය තුළ වර්තමාන විවෘත සමාජයන්හි සමාජ ව්‍යාප්තියට ඉඩ සැලසේ. පොදු ක්ෂේත්‍රය මනසෙහි මෙන්ම ශරීරයෙහි අවකාශයකි. මාධ්‍ය බලපෑම් හේතුවෙන් සමාජ ගැටුම් පිළිබඳ මහජන සැලකිල්ල තීව්‍ර වේ. (Jakubowicz,2005), එබැවින් මාධ්‍ය වැඩි වැඩියෙන් අවධානය යොමු කරන්නේ විසන්ධි කිරීම, ප්‍රචණ්ඩත්වය සහ අන්තර් කණ්ඩායම් ප්‍රතිවිරෝධතා යන සාධක සඳහා බව ඔහුගේ පර්යේෂණ ලිපියෙන් කියැවේ.

"The Role of Mass Media in Promoting National Cohesion( a Case Study of Marsabit County" නමින් 2013 වර්ෂයේදී "Guyo. Abdirizak G" සිදු කරන ලද පර්යේෂණ ලිපියද මෙහිදී වැදගත් වේ. මෙම අධ්‍යයනය මගින් ජන මාධ්‍යවල කාර්යභාරය තහවුරු කිරීමට උත්සාහ කර ඇත. මෙහිදී ප්‍රාදේශීය ගැටුම් උත්සන්න

වීමේදී මාධ්‍ය පිළිබඳව ගවේෂණය කිරීම සිදු කරයි. ප්‍රතිචාර දැක්වූවන් ප්‍රදේශයේ ඇති වූ ගැටුම් අවම කිරීමට ජනමාධ්‍ය ක්‍රියා කර ඇති බව දක්වා ඇති අතර නිවැරදි හා වෛෂයික වාර්තාකරණය ජනමාධ්‍ය හරහා සිදුවන බව ද සඳහන් කර ඇත. එසේම මාධ්‍ය ගැටුම් උත්සන්න කළ ප්‍රධාන මාර්ගයක් බව ද හඳුනාගෙන ඇති බව දක්වයි.

"Media for Peace and Cohesion" නමින් "Skitter W. Mbugua"පර්යේෂණ ලිපියට අනුව, සමාජය තුළ සාමය සහ සහජීවනය ප්‍රවර්ධනය කිරීමේදී මාධ්‍යයට සැලකිය යුතු කාර්යභාරයක් ඇත. බොහෝ රටවල මාධ්‍ය සැලකෙන්නේ ආණ්ඩුවේ මුර බල්ලෙකු ලෙස ක්‍රියා කරන සහ බලයේ සිටින අයට වගකියන සිව්වන බූදලය ලෙසය. කෙසේ වෙතත්, මාධ්‍යයට ප්‍රවෘත්ති වාර්තා කිරීමට වඩා බොහෝ දේ කළ හැකිය. විවිධ ප්‍රජාවන් අතර අවබෝධය, සංවාදය සහ ඉවසීම ප්‍රවර්ධනය කිරීමෙන් සාමය සහ එකමුතුකම සඳහා එය ප්‍රබල බලවේගයක් විය හැකි බව දක්වා ඇත.විවිධ හඬවල් සඳහා වේදිකාවක් සැපයීම, ධනාත්මක කථා ඉස්මතු කිරීම, සංවාද සහ විවාද ප්‍රවර්ධනය කිරීම සහ පුවත්පත් කලාවේ ඉහළම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම මගින් විවිධ කණ්ඩායම් අතර අවබෝධය, ඉවසීම සහ සහයෝගීතාව වර්ධනය කිරීමට මාධ්‍යයට උපකාර කළ හැකි බව දක්වයි.

"Promoting social cohesion( the role of community media" නමින් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයේ "Peter M. Lewis" සහ සන්ඩර්ලන්ඩ් විශ්ව විද්‍යාලයේ "Caroline Mitchell" විසින් සිදු කරන ලද අධ්‍යනය ද මෙහිදී වැදගත් වේ. මෙම අධ්‍යනයෙන් ප්‍රජා මාධ්‍ය සහ සමාජ ඒකාබද්ධතාවය අතර ඇති සම්බන්ධය විමර්ශනය කර ඇත. "තුන්වන අංශයේ මාධ්‍ය" පිළිබඳ විවිධ නිර්වචන සාරාංශ කර ඇත. ජනමාධ්‍යවල භූමිකාවේ ධනාත්මක හා සෘණාත්මක අංශ පිළිබඳ සාකච්ඡාව ගෙනහැර දක්වයි. සමකාලීන යුරෝපයේ සාමාජිකත්වය, පුරවැසිභාවයේ අයිතිවාසිකම් සහ බැඳීම් කෙරෙහි ජනමාධ්‍ය ප්‍රබල සැලකිල්ලක් දක්වා ඇති බව දක්වයි.

**අධ්‍යයනයේ සීමා**

**සංකල්පීය සීමා**

- "සමාජ එක්සත් භාවය සහතික කිරීමේදී ජනමාධ්‍යයේ කාර්යයභාරය" පිළිබඳ ශ්‍රී ලංකාව තුළ පර්යේෂණ අධ්‍යයනයන්ගේ භාවිතය විරල හෙයින් ඒ පිළිබඳ අදහස් දැක් වූ විදේශීය අධ්‍යයන, ග්‍රන්ථ හා ලිපි කිහිපයකට සිදුවිය.
- දත්ත රැස්කිරීමේදී පුද්ගල අනන්‍යතාව, පෞද්ගලිකත්වයට ඇති අයිතිය, සංස්කෘතික සීමා ආදි ලක්ෂණ දත්ත දායකයා වෙත ළඟාවීමේ දී යම් සීමාකාරී ස්වභාවයක් ඇති කිරීම නොවැළැක්විය හැකි විය.

**නියැදි සීමා**

- මෙහිදී "ශ්‍රී ලාංකේය සමාජයේ තරුණ සිසුන්" ඉලක්ක වුවත් "ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තරුණ සිසුන් 50 දෙනෙකු" වෙත නියැදිය සීමාවේ.
- මෙම පර්යේෂණ අධ්‍යයනය් දී දත්ත දායකයින් ලෙස සහභාගි කර ගනු ලැබුවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලීය තරුණ සිසුන් ය. එහිදී, අධ්‍යයනයට අදාළ ප්‍රශ්නාවලිය සඳහා තොරතුරු ලබා ගැනීමට බොහෝ දුරට මාර්ගගත ක්‍රමවේදය යොදා ගැණිනි. ඒ අනුව සම්පත් දායකයින් සෘජුව මුණ ගැසීමේ සීමාවට පර්යේෂකයා මුහුණ දීම සිදු විය.

**අධ්‍යයනයේ වැදගත්කම**

නූතන සමාජයේ පවතින සමාජ, ආර්ථීක, දේශපාලන, තත්ත්වයන් තුළ ජාතිය, ආගම, ධනය, බලය, කුලය ආදී විවිධ තත්ත්වයන්ගෙන් සමාජ පරස්පරතාවයන් හා ප්‍රතිවිරුද්ධ අදහස් ගොඩනැගීම නොවැළැක්විය හැකි තත්ත්වයකි. එකී තත්ත්වය හමුවේ ඊට ප්‍රතිවිරුද්ධව ක්‍රියා කළ හැකි ප්‍රබලතම මෙවලම ජනමාධ්‍යයි. ජනමාධ්‍ය මගින් සිදුකරනු ලබන සමාජ සංවිධානාත්මක කාර්යය, මතවාදී කාර්යය, සංස්කෘතික කාර්යය හරහා ජනමාධ්‍යයට සමාජයේ එක්සත්භාවය සඳහා ප්‍රබල කාර්යභාරයක් කළ හැකිය. සමාජ එක්සත්භාවය සඳහා සහතික කිරීමේදී ජනමාධ්‍යයේ කාර්යය අධ්‍යයනය කිරීම කාලීනමය වැදගත්කමක් උසුලන්නා වූ අධ්‍යනයක් බව මා හැඟීමයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

**පර්යේෂණ පිරිසැලසුම**

කුමන හෝ ජන වර්ගයක් වේවා ඉතාම සමීපතම ඇසුරක් දක්වන්නේ ජනමාධ්‍ය කෙරෙහි ය. නූතන සමාජය තුළ දැඩිව ග්‍රහණය කර ගත් මෙම "ජනමාධ්‍ය" තරුණ ප්‍රජාව සමඟ දක්වන්නෙ සුහදශීලී සම්බන්ධතාවයකි. ජනතාව වෙත විශ්වාසනීය තොරතුරු සපයන්නෙක් ලෙස හා මහගු කාර්යය ගොන්නක වගකීම පවතින වත්මන් ජනමාධ්‍ය සමාජ එක්සත්භාවය සහතික කිරීමේ කාර්යයේ ද නිරත වේ. එහෙයින් " සමාජ එක්සත් භාවය සහතික කිරීමේදී ජනමාධ්‍යයේ කාර්යයභාරය" නම් මාගේ පර්යේෂණ ගැටලුව කොටස් දහයක් ආශ්‍රයෙන් විමර්ශනය කෙරේ. එසේ තේරීමට පාත්‍ර වූ උක්ත ගැටලුව පිළිබඳ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තරුණ ප්‍රජාව තුළින් "මාගේ අභිමතය පරිදි තෝරාගත් සිසුන් 50 දෙනකුගේ අත්දැකීම" පරික්ෂා කිරීම හරහා සිදු කරන්නේය. ඒ ඔස්සේ "සමාජ එක්සත් භාවය සහතික කිරීමේදී ජනමාධ්‍යයේ කාර්යයභාරය කෙබඳුදැයි සොයා බැලීම " නම් මාගේ අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ සාක්ශාත් වනු ඇත.

**සංගහනය**

ශ්‍රී ලාංකේය සමාජය තුළ වෙසෙන "තරුණ ශිෂ්‍යයන්" යන්න මාගේ පර්යේෂණ අධ්‍යනයේ සංගහණයයයි.

**අධ්‍යයන ප්‍රදේශය**

"සමාජ එක්සත් භාවය සහතික කිරීමේදී ජනමාධ්‍යයේ කාර්යයභාරය" නම් පර්යේෂණ ගැටලුවට අදාළව අධ්‍යයන ප්‍රදේශය වන්නේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයි. මෙය ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ විශ්වවිද්‍යාල අතුරින් එකකි. ලංකාවේ අගනුවර වන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගරයට නුදුරින් මිරිහාන පොලිස් බල ප්‍රදේශය තුළ ගංගොඩවිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇත. අක්කර 54ක් පුරා විහිදෙන මෙම විශ්වවිද්‍යාලය තුළ කළමනාකරණ හා වාණිජ විද්‍යා, ව්‍යවහාරික විද්‍යා, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා, වෛද්‍ය විද්‍යා, පශ්චාද් උපාධි අධ්‍යයන, ඉංජිනේරු හා තාක්ෂණ යනුවෙන් පීඨ 07 කින් සමන්විත වේ. ඒ අනුව, මගේ පර්යේෂණය විශ්වවිද්‍යාලය තුළ ඉගෙනුම ලබන සිසුන් 50 දෙනෙකුගෙන් සමන්විත වූ අතර ඒ ආකාරයෙන් අධ්‍යයන ප්‍රදේශය ලෙස "ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය" හඳුනා ගැනිණි.

**නියැදි ප්‍රමාණය හා ක්‍රම**

**නියැදි ප්‍රමාණය**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මූලික කරගනිමින් මාගේ අභිමතය අනුව තරුණ සිසුන් 50 දෙනෙකු නියැදිය ලෙස තෝරා ගන්නා ලදී.

**නියැඳි ක්‍රමය**

මෙම පර්යේෂණ අධ්‍යයනය සඳහා අසම්භාවී නියැදි ක්‍රමයට අයත් "අභිමතානුසාරී නියැදිය" තෝරා ගන්නා ලදී.

**දත්ත එක් රැස් කිරීමේ ක්‍රමවේදය**

**ද්වීතීක මූලාශ්‍ර**

- අන්තර්ජාලය, වෙබ් අඩවි හා ලිපි
- සමාජ ජාල
- පොත්
- පර්යේෂණ වාර්තා හා ලිපි

**ප්‍රාථමික මූලාශ්‍ර**

**ප්‍රශ්නාවලිය**

මෙහිදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිසුන් 50 දෙනකු වෙත උක්ත තේමාවට අදාළ ප්‍රශ්නවලියක් ඉදිරිපත් කිරීම හරහා දත්ත ලබාගන්නා ලදී.

**දත්ත විශ්ලේෂණය**

මෙහිදී මූලික වශයෙන් ප්‍රාථමික මූලාශ්‍ර ලෙස "ප්‍රශ්ණාවලිය" යොදා ගනිමින් ලබාගන්නා දත්ත හා ද්විතියික දත්ත හරහා ලබාගන්නා දත්ත ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන දිවිත්ව විශ්ලේෂණාත්මක උපක්‍රම ඔස්සේ විශ්ලේෂණයන්ට භාජනය කොට ඇත.

**ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය**

ප්‍රශ්ණාවලි ක්‍රමය ඔස්සේ ලබා ගත් දත්ත සංඛ්‍යාත්මක ක්‍රමවේද භාවිතා කරමින් විමසා බැලේ. එහිදී, සරල සංඛ්‍යානමය මිනුම්, වගු, ප්‍රස්තාර, ප්‍රතිශත ආදිය භාවිතා කරන ලදී.

**ගුණාත්මක දත්ත විශ්ලේෂණය**

ප්‍රශ්ණාවලිය තුළ ඇති විවෘත ප්‍රශ්න සංඛ්‍යානමය වශයෙන් මුල් අවස්ථාවේදී විමර්ශනය සිදු කළ අතර, පසුව ගුණාත්මක විග්‍රහයන්ට ලක් කර එම තොරතුරු ඉදිරිපත් කොට තිබේ.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

"සමාජ එක්සත්භාවය සහතික කිරීමේදී ජනමාධ්‍යයේ කාර්යභාරය" නම් පර්යේෂණයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පෙරටු කරගනිමින් සිදු කරන්නා වූ දත්ත විශ්ලේෂණය සිදු වන්නේ සමාජ එක්සත්භාවය සහතික කිරීමේදී ජනමාධ්‍යයෙන් සිදු වන "ප්‍රධාන කාර්යයන් 08ක්" මූලික කරගනිමිනි. එනම්,

- විවිධ හඬවල් සඳහා වේදිකාවක් සැපයීම.
- ධනාත්මක කතා ඉස්මතු කිරීම
- ජනවාර්ගික ගැටුම් මැඩලීම.
- පොදු ජනමාධ්‍ය අන්තර්ගතයන් ඉදිරිපත් කිරීම.
- එක්සත් පණිවුඩ ප්‍රචලිත කිරීම.
- එක්සත් සංවර්ධන වැඩසටහන් දියත් කිරීම.
- සාමකාමී වැඩසටහන් දියත් කිරීම.
- ජනමාධ්‍ය ආචාර ධර්මවලට අනුගත වීම.

ආවෘත ප්‍රශ්නයන්ගෙන් යුක්ත ප්‍රශ්ණාවලිය ආධාරයෙන් දත්ත විශ්ලේෂණය ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන ද්විත්ව විශ්ලේෂණාත්මක උපක්‍රමයන්ට භාජනය වී ඇත. මූලික විමර්ශනයේදී නියැදිය තුළ අදාළ කාර්යයන් වෙන වෙනම ගනිමින් සංඛ්‍යාත්මක ඉදිරිපත් කිරීම් ලෙස ගෙන එන අතර පසුව ඒවා ගුණාත්මක විශ්ලේෂණයට බඳුන් වේ.


**පර්යේෂණය සඳහා යොදාගත් නියැදිය පිළිබඳ විශ්ලේෂණය**

වගුව 1: තෝරාගත් නියැදිය අධ්‍යයන වර්ෂය අනුව වර්ගීකරණය

| අධ්‍යයන වර්ෂය | දත්ත දායකයින් සංඛ්‍යාව |
|---|---|
| පළමු වසර | 5 |
| දෙවන වසර | 9 |
| තෙවන වසර | 12 |
| සිව්වන වසර | 24 |
| එකතුව | 50 |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2024

"සමාජ එක්සත්භාවය සහතික කිරීමේදී ජනමාධ්‍යයේ කාර්යභාරය" තේමා කොටගත් මගේ පර්යේෂණය සඳහා තෝරාගත් නියැදිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ආශ්‍රයෙන් ගොඩනැගුණි. විශ්වවිද්‍යාලය තුළ අධ්‍යාපනය හදාරන සිසුන් අවුරුදු 21-29 වැනි වයස් සීමාවකින් පසු වන බැවින් "තරුණ" නම් වයස් කාණ්ඩය ඉලක්ක කොට ගනිමින් එය සිදු වූ බව සනාථ කළ හැකිය. එහිදී සමස්ත නියැදිය විශ්වවිද්‍යාලයේ වසර හතරෙහිම සිසුන් ගෙන් සමන්විත විය. ඉහත දක්වන ලද වගුව 1 තුළින් වසර හතරෙහිම සිසුන් නිරූපණය වන අතර එහිදී වැඩි පිරිසක් සිව්වන වසරේ සිසුන් බව නිරූපනය වේ. එම පිරිස 24 දෙනෙකු වන අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 48% කි. එසේම මෙහිදී තෙවන වසර සිසුන් 12 දෙනෙකුත්, දෙවන වසරේ සිසුන් 09 දෙනකුත්, පළමු වසර සිසුන් 5 දෙනෙකුත් වශයෙන් නියැදියට ඇතුළත් කර ගැනීම සිදුකර ඇති බව විශ්ලේෂණය තුළින් පැහැදිලි වේ.





මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2024

රූපය 1: තෝරාගත් නියැදිය ස්ත්‍රී පුරුෂභාවය අනුව වර්ගීකරණය

වැඩිදුරටත් දත්ත ලබාගත් පිරිසගේ පුම්තිරිභාවය විශ්ලේෂණයට ලක් කරන්නේ නම් සමස්ත නියැදියෙන් 58%ක ප්‍රතිශතයක් ස්ත්‍රී පාර්ශ්වයෙන් දත්ත ලබා ගැනීම සිදු වූ අතර අතර එම පිරිස 29 කි. පුරුෂ පාර්ශවය 21 දෙනකු ලෙසින් 42% ක ප්‍රතිශතයකින් නිරූපණය වේ.

**විවිධ හඬවල් සඳහා වේදිකාවක් සැපයීම**





මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2024

රූපය 2: ජනමාධ්‍ය සෑම ජනවර්ගයකටම එක හා සමාන ලෙස අදහස් පළ කරන බව පිළිගැනීම

ජනමාධ්‍යට විශාල වේදිකාවකට ආමන්ත්‍රණය කිරීමේ හැකියාව ඇත. ජනමාධ්‍ය විශාරදයෙකු වූ "මාර්ෂල් මැක්ලූහන්" පවසන්නේ "ජනමාධ්‍ය හේතුවෙන් ලෝකයම විශ්ව ගම්මානයක් බවට පත්වූ බවයි. එහෙයින් සෑම ජනවාර්ගයකටම එක හා සමානව අදහස් උකහා ගැනීමේ හැකියාව ජනමාධ්‍ය නිසා බිහිවී ඇත. එමෙන්ම සියලු දෙනාට තම මතය හඬ නගා පැවසීමට වේදිකාවක් ජනමාධ්‍ය නිසා නිර්මිතව ඇත. මාගේ තෝරාගත් නියැදිය වෙත යොමු කරන ලද පැනයෙන් 52% ක ප්‍රතිශතයක් මේ කාර්යය ජනමාධ්‍ය විසින් සිදු කරන බව පිළිගනී. එහෙත් 48% ප්‍රමාණයක් මීට ප්‍රතික්ෂේපිත දත්ත ලබා දී ඇති බව ඉදිරිපත් කොට ඇත.

**ධනාත්මක කතා ඉස්මතු කිරීම**





මූලාශ්‍රයː සමීක්ෂණ දත්ත, 2024

රූපය 3: ජනමාධ්‍ය ජනවාර්ගික අර්බුදය මැඩලිය හැකි සාමකාමී අදහස් හෙළි දරව් කිරීමට වැඩි වශයෙන් අවකාශය දෙන්නේ යැයි පිළිගැනීම

ජනමාධ්‍ය ප්‍රවෘත්ති හා අදහස් මවන සුළුය. නව සිදුවීම් හා කතා වස්තු නොමැති අවස්ථාවලදී නව්‍ය කතාබහක් සමාජය තුළට ජනිත කිරීමේ තරම් බලයක් වත්මන් ජනමාධ්‍ය සතුව ඇත. මාධ්‍ය නාලිකාවන් අතර මේ සඳහා තරගකාරීත්වයක් දැකිය හැකිය. "ජනමාධ්‍ය ජනවාර්ගික අර්බුදය මැඩලිය හැකි සාමකාමී අදහස් හෙළිදරව් කිරීමට වැඩි වශයෙන් අවකාශය දෙන්නේ යැයි ඔබ සිතන්නේ ද?" නම් ගැටලුව මා විසින් විමසන ලද්දේ සමාජ එක්සත්භාවය උදෙසා ජනමාධ්‍යයේ කාර්යයභාරය හඳුනාගැනීම පෙරටු කොටගෙනය. ඊට 66%ක පමණ සැලකිය යුතු පිරිසක් එකඟ වන නමුත් සියයට 34%ක ප්‍රමාණයක් ජනමාධ්‍ය මෙම කාර්යයේ නිරත නොවන බවට එකඟ වේ.


**ජනවාර්ගික ගැටුම් මැඩලීම**




මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2024

රූපය 4: ජනමාධ්‍ය පොදු ජන කොටස් එකඟ නොවන, බෙදීම් ඇති කරවන කරුණු ප්‍රකාශයට පත් කිරීමට වැඩි වශයෙන් ක්‍රියාකරන බව පිළිගැනීම

රට තුළ වෙසෙන ජන වර්ගයන් තුළ විවිධ සිදුවීම් හේතුවෙන් ප්‍රශ්න මතුවේ. මෙවැනි අවස්ථාවලදී ජනමාධ්‍ය සතු බලය සමාජ එක්සත්භාවයට යොදවන්වනේද යන්න හඳුනා ගැනීම වටී. "ජනමාධ්‍ය පොදු ජන කොටස් එකඟ නොවන බෙදීම් ඇති කරවන කරුණු ප්‍රකාශයට පත් කිරීමට වැඩි වශයෙන් ක්‍රියා කරන්නේයැයි ඔබ සිතන්නේ ද?" නම් පැනයට මාගේ පර්යේෂණ නියැදියෙන් 46%ක පිරිසක් එකඟ වී ඇත. නමුත් 54% ක පිරිසක් පමණක් එකඟ වී නැත. මෙය ජනමාධ්‍ය සමාජ එක්සත්භාවයේ කාර්යය සිදු කරන්නේද යන්න වක්‍රාකාරයෙන් සිතන්නට යමක් ඇත.





මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2024

රූපය 5: ජනවාර්ගික සමගිය වර්ධනයට ජනමාධ්‍ය අන්තර්ගත ඉදිරිපත් කරන බව පිළිගැනීම

තවදුරටත් තහවුරු කර ගැනීම උදෙසා මාගේ පැනය වූයේ "ජනවාර්ගික සමගිය වර්ධනයට ජනමාධ්‍ය අන්තර්ගත ඉදිරිපත් කරන්නේ යැයි ඔබ සිතන්නේ ද?"යන්නයි. ඊට පක්ෂපාතිත්වය 52%ක ප්‍රතිශතයක් දක්වා ඇති අතර 48%ක ප්‍රතිශතයක් ඊට එකඟ වී නැත.


**පොදු ජනමාධ්‍ය අන්තර්ගතයන් ඉදිරිපත් කිරීම**




මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2024

රූපය 6: ජනමාධ්‍ය අන්තර්ගතය වෛරී පණිවිඩ සහ කටකතාවලට මායිම් වන බව පිළිගැනීම

ප්‍රවෘත්ති, වාර්තාමය වැඩසටහන්, ටෙලි නාට්‍ය, ක්‍රීඩා වැඩසටහන් ආදී ජනමාධ්‍ය වැඩසටහන්හි අන්තර්ගතය සියලු දෙනාට පොදු විය යුතුය. මෙහිදී මා නගන ලද පැනයක් වූයේ " ජනමාධ්‍ය අන්තර්ගතය වෛරී පණිවිඩ සහ කටකතාවලට මායිම් වන්නේ යැයි සිතන්නේ ද? "යන්නයි. ජනමාධ්‍ය මඟින් මීට පටහැනිව යමින් සමාජ එක්සත්භාවය පළුදුවන්නේ ද යන්න මට හඳුනා ගැනීමට අවශ්‍ය විය. ඒ අනුව 48%ක ප්‍රතිශතයක් මෙම පැනයට එකඟ වී ඇති අතර 52% ක වැඩි පිරිසක් එකඟ වී නොමැති හෙයින් ජනමාධ්‍ය සැලකිය යුතු ප්‍රමාණයකින් ජනමාධ්‍ය සතු අන්තර්ගතයන් සමාජ එක්සත්භාවයට තුඩු දෙන අයුරින් නිර්මිතව ඇති බව පැහැදිලි වේ.





මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2024

රූපය 7: කලකෝලහාල ඇති වන අවස්ථා හෝ කැරලි කෝලාහල හැසිරීම්වලට හේතුවන සිද්ධීන් ප්‍රකාශයට වැඩි වශයෙන් තුඩු දෙන්නේ යැයි පිළිගැනීම

ඒ හා සමානව අසන ලද අනෙක් පැනය උදෙසා ද 52%ක ප්‍රතිශතයකින් එය ප්‍රතික්ෂේප වී ඇති අතර සියයට 48% ප්‍රමාණයක් එය පිළිගෙන ඇත.


**එක්සත් පණිවුඩ ප්‍රචලිත කිරීම**




මූලාශ්‍රයː සමීක්ෂණ දත්ත, 2024

රූපය 8: ප්‍රජාවන්ට සමාජ, දේශපාලන, ආර්ථික, දේශපාලන පැතිකඩ ආරවුලකින් තොරව පවත්වා ගැනීමට උදව් කරන්නේ යැයි පිළිගැනීම

ජනමාධ්‍ය මගින් ප්‍රජාවන්ට සමාජ, දේශපාලන, ආර්ථික, දේශපාලන පැතිකඩ ආරවුලකින් තොරව පවත්වා ගැනීමට උදව් විය යුතුය. මේ සඳහා ජනවර්ග අතර සාමකාමී අදහස් ප්‍රචලිත කර යුතුය. නිරීක්ෂිත දත්ත අනුව පෙනී යන්නේ මෙකී කාර්ය ජනමාධ්‍ය මගින් සැලකිය යුතු මට්ටමකින් සිදුවන බවයි. නියැදියෙන් 76%ක ප්‍රමාණයක් එයට එකඟ වී ඇති අතර 24%ක ප්‍රමාණයක් ඊට එකඟ වී නැත.





මූලාශ්‍රයː සමීක්ෂණ දත්ත, 2024

රූපය 9: ජනමාධ්‍ය තුළින් සහජීවනයෙන් යුත් පැතිකඩ ගොඩනැගීම උදෙසා පණිවිඩ යෝජනා වනු ඇතැයි පිළිගැනීම

ඒ හා සමානව අසන ලද පැනයක් නම් " ජනමාධ්‍ය තුළින් සහජීවනයෙන් යුත් පැතිකඩ ගොඩනැගීම උදෙසා පණිවිඩ යෝජනා වනු ඇතැයි සිතන්නේ ද?" යන්නයි. එහිදී ද 76%ක ප්‍රතිශතයක් පෙන්වන හෙයින් සැලකිය යුතු ප්‍රමාණයකින් මෙකී කාලය සිදුවන බව පෙනෙන අතර එසේ නොවන්නේ 24%ක ප්‍රතිශතයකි.

**එක්සත් සංවර්ධන වැඩසටහන් දියත් කිරීම**





මූලාශ්‍රයː සමීක්ෂණ දත්ත, 2024

රූපය 10: ජනවාර්ගික කණ්ඩායම්, සංස්කෘතීන් සහ විශ්වාස පද්ධති අනුව විවිධත්වය අගය කිරීම උදෙසා සංවර්ධන වැඩසටහන් දියත් කරන්නේ යැයි පිළිගැනීම

එක්සත්භාවය සහිත රටක් උදෙසා ජනවාර්ගික කණ්ඩායම්, සංස්කෘතීන් සහ විශ්වාස පද්ධති අනුව විවිධත්වය අගයමින් එක්සත්භාවය උදෙසා සංවර්ධන වැඩසටහන් දියත් කළ යුතුය. ජනමාධ්‍ය මගින් මෙකී කාර්යය සිදුවන බව 72%ක පිරිසක් පෙන්වා දී ඇත. එය 28% ක සුලු ප්‍රතිශතයක් පිළිගෙන නැත.

**සාමකාමී වැඩසටහන් දියත් කිරීම**





මූලාශ්‍රයː සමීක්ෂණ දත්ත, 2024

රූපය 11: වෛරය, ඊර්ෂියාව, පළිගැනීම ආදී අසම්මතයන්ගෙන් පිරී පවතින අර්බුදකාරී දෑ ජනමාධ්‍ය මගින් ප්‍රචලිත කරන්නේ යැයි පිළිගැනීම

සමාජ එක්සත් භාවය සහතික කිරීමේදී ජනමාධ්‍ය විසින් සාමකාමී වැඩසටහන් ඉදිරිපත් කරන්නේද යන්න මා විසින් සොයා බැලීම සඳහා දායකයින් වෙත නගන ලද "වෛරය, ඊර්ෂියාව, පළිගැනීම ආදී අසම්මතයන්ගෙන් පිරී පවතින අර්බුදකාරී දෑ ජනමාධ්‍ය මගින් ප්‍රචලිත කරන්නේ යැයි ඔබ සිතන්නේ ද?" පැනයෙන් 86%ක ප්‍රමාණයක් ඊට එකඟ වී ඇත. මෙය සමාජයක් එක්සත්භාවය සහතික කිරීමේ කාර්යයට ජනමාධ්‍ය ක්‍රියා නොකරන බවට තරමක් වක්‍ර හෙළිදරව්වකි.


**ජනමාධ්‍ය ආචාර ධර්මවලට අනුගත වීම**




මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2024

රූපය 12: ජනමාධ්‍ය හරහා පහත ආචාරධර්ම අර්ථවත් වීම


ජනමාධ්‍ය මෙහෙයවන්නේ ජනමාධ්‍යයට අනුගත වන ආචාර ධර්ම පද්ධතියකට යටත්වය. ජනමාධ්‍ය පිළිගත්ආචාර ධර්මවලට අනුගතව ජනමාධ්‍ය කටයුතු කරන්නේද යන්න පිළිගැනීම පරීක්ෂා කිරීම හමුවේ නියැදියෙන් 86%ක ප්‍රතිශතයක් "සත්‍යවාදී බව" නම් ආචාර ධර්මය ජනමාධ්‍ය හරහා අර්ථවත් වන බව පිළිගෙන ඇත. "නිදහස" නම් ජනමාධ්‍ය ආචාර ධර්මය ජනමාධ්‍ය හරහා අර්ථවත් වන බව නියැදියෙන් 80%ක් පිළිගෙන ඇති අතර "හානිය අවම කිරීම" ජනමාධ්‍ය හරහා අර්ථවත් වන බව සියයට 46% ක ප්‍රතිශතයක් පිළිගෙන ඇත. එසේම "වගකිවයුතු බව" 62% ක ප්‍රතිශතයකින් පිළිගෙන ඇත.




මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2024

රූපය 13: ජනමාධ්‍යයන්ගෙන් සමාජ එක්සත්භාවය සහතික වීම

ජනමාධ්‍යන් ලෙස මූලික වශයෙන් ගැනෙන්නේ පුවත්පත, ගුවන් විදුලිය, රූපවාහිනිය හා සිනමාවයි. මෙකී මාධ්‍යයන් සමාජ එක්සත්භාවය සහතික කිරීමේ කාර්යය සඳහා දායක වන බව පිළිගැනීම සඳහා මා මේ පැනය යොමු කරන ලදී. ඒ අනුව රූපවාහිනිය නියැදියෙන් වැඩිම ප්‍රතිශතයක් පෙන්වමින් සමාජ එක්සත්භාවය සහතික කිරීමේ කාර්යයේ නිරත වන අතර අඩුම කාර්කයයක නිරත වන බව නියැදියට අනුව පෙන්වන්නේ සිනමාවයි. පුවත්පත 64%ක ප්‍රතිශතයකින් හා ගුවන් විදුලිය 46% ප්‍රතිශතයකින් මෙකී කාර්යය සිදුකරන බව නියැදියට අනුව සාක්ෂාත් වේ.




මූලාශ්‍රයː සමීක්ෂණ දත්ත, 2024

රූපය 14: සමාජ එක්සත්භාවය සහතික කිරීමට ජනමාධ්‍ය පිටුවහලක් වන්නේ යැයි පිළිගැනීම

අවසාන පැනය ඍජු ප්‍රශ්නයකි. ඉහත අසන ලද වක්‍ර ප්‍රශ්නයන්ගෙන් හා මේ ඍජු ප්‍රශ්නයෙන් මා හඳුනා ගැනීමට තැත් කරනු ලැබුවේ සමාජ එක්සත්භාවය සහතික කිරීමේදී ජනමාධ්‍ය විසින් කාර්යයභාරයක් කරන බව නියැදිය පිළිගන්නේ ද යන්නයි. ඒ අනුව 70%ක වැඩි ප්‍රතිශතයකින් ඒ බව සනාථ වන අතර 30% ක සුළු ප්‍රතිශතයකින් එය ප්‍රතික්ෂේප කොට ඇත.

**නිගමන**

මිනිස් පැවැත්ම චිරස්ථායි කරනුවස් ලෝක ඉතිහාසය පුරා බලපෑම් සහගත වූ සාධක අතර මානව සන්නිවේදන හැකියාවන්ට හිමි වනුයේ අද්විතීය ස්ථානයකි. මානව සන්නිවේදනය අන්තර් පුද්ගල සන්නිවේදනයේ සිට මිලියන සංඛ්‍යාත ජන රාශීන් වෙත කෙරෙන පොදු ආමන්ත්‍රණයක් දක්වා වූ අතිශය පුළුල් පරාසයක පැතිරෙමින් මානව සන්නිවේදනයේ විවිධ අවශ්‍යතා හසුරවනු ලබන්නා වූ ප්‍රධාන බලවේගයක් ලෙස ක්‍රියා කරන බව නොරහසකි. එහිදී, නූතන සමාජ පරිසරය තුළ අන්තර් පුද්ගල සන්නිවේදනය කුළුගන්වන කේන්ද්‍රීය තාක්ෂණික මෙවලමක් බවට ජනමාධ්‍ය පත්ව ඇත.

උක්ත සන්නිවේදන තාක්ෂණයේ නැඟීමත් සමඟ සමාජ ආකෘතීන් ඓතිහාසික ලෙස පරිණාමනය කොට ඇත. ජාලගත සමාජය යනු හුදකලා (Isolated) වූවක් නොව අධි

සමාජීය (Hypersocial) ස්වභාවයකට සමාජ ස්වභාවය රැගෙන එන්නක් ලෙස ලේඛකයෝ විස්තර කරති. ජාලගත සමාජයේ තොරතුරු නිෂ්පාදනය, තොරතුරු සන්නිවේදනය හා භාවිතයට සමාජ අන්තර් ක්‍රියාවන් සෘජු බලපෑමක් ඇති කොට තිබේ. නූතන සමාජ ස්වභාවය තුළ සංසරණය වන තොරතුරු ප්‍රමාණය අති දැවැන්ත ලෙස ඉහළ ගොස් ඇත. සමාජ ව්‍යුහය තුළ නිෂ්පාදනය වන හා සංසරණය වන තොරතුරු අතිමහත් ලෙස වර්ධනය වීමත්, පුද්ගල සමාජ සංස්කෘතික පරිසරයක් නිර්මාණය වීමත්, ඒ තුළට ජනමාධ්‍ය ආගමනය වීමත් යන ත්‍රිත්ව කරුණු එක්ව ගත් විට නිර්මාණය වන නව සමාජ සන්දර්භය තුළ එක්සත්භාවය සඳහා ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය හේතු වන්නේ ය.

සමාජ ඒකාබද්ධතාවය යනු සමානාත්මතාව යන්නෙන් අදහස් නොවේ. වෙනස්කම්වලට ගරු කිරීම, සමාන අවස්ථා සහ සියලු සාමාජිකයන්ගේ වටිනාකම ඇතුළත් බව සහතික කරන, ප්‍රතිපත්තිවලට ගරු කරන, විවිධ කණ්ඩායම්වලට සහ සමාජයන්ට ඉහළ මට්ටමේ එකමුතුවක් අත්කර ගත හැකි තත්වයකි.

අපගේ පර්යේෂණ ගැටලුව හමුවේ "සමාජ එක්සත්භාවය සහතික කිරීමේදී ජනමාධ්‍යයේ කාර්යභාරය" සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තරුණ සිසු අත්දැකීම විමර්ශනය කෙරිණි. එහිදී, අසම්භාවී නියැදි ක්‍රමයට අයත් අභිමතානුසාරී නියැදිය භාවිතයට ගැණුනු අතර "ප්‍රශ්ණාවලි ක්‍රමය" ඔස්සේ සිසුන් 50 දෙනකු යොදා ගනිමින් දත්ත එක් රැස් කෙරිණි. එහිදී ප්‍රමාණාත්මක හා ගුණාත්මක පර්යේෂණ එළඹුම් භාවිතයට ගැනීම ඔස්සේ සමාජ එක්සත්භාවය සහතික කිරීමේදී ජනමාධ්‍යයේ කාර්යභාරය කෙබඳුදැයි සොයා බැලීම යන අරමුණ සාක්ෂාත් වූයේ, ජනමාධ්‍ය සමාජ එක්සත්භාවය සහතික කිරීමේදී සැලකිය යුතු කාර්යභාරයක් තත්කාලීන ශ්‍රී ලාංකේය සමාජය තුළ සිදු කරන බව තහවුරු කරමිනි. විවිධ හඬවල් සඳහා වේදිකාවක් සැපයීම, ධනාත්මක කතා ඉස්මතු කිරීම, ජනවාර්ගික ගැටුම් මැඩලීම, පොදු ජනමාධ්‍ය අන්තර්ගතයන් ඉදිරිපත් කිරීම, එක්සත් පණිවුඩ ප්‍රචලිත කිරීම, එක්සත් සංවර්ධන වැඩසටහන් දියත් කිරීම, සාමකාමී වැඩසටහන් දියත් කිරීම, ජනමාධ්‍ය ආචාර ධර්මවලට අනුගත වීම යන කාර්යයන් උක්ත පර්යේෂණය හරහා සැලකිල්ලට භාජනය කෙරිණි. එහෙයින් සමස්ත පර්යේෂණය හමුවේ සාක්ෂාත් කර ගැනීමට හැකි වූ නිගමන ගණනාවකි.

- තත්කාලීන ශ්‍රී ලාංකික සමාජය තුළ ජනමාධ්‍ය ප්‍රධාන බලවේගයක් ලෙස ක්‍රියා කරන බව නිගමනය විය.
- එක්සත්භාවය යනු  දේශපාලනික, ආර්ථික හා සමාජීය වශයෙන් සහජීවනයෙන් පිරුණු ඒකාග්‍ර වූ සාධාරණ සමාජයක් බවට ලෙස සහතික වීම බව නිගමනය විය.
- පිළිගත් ජනමාධ්‍ය කාර්යයන් තුළ සමාජ එසත්භාවයට අදාළ කාර්යයන් ගැබ්ව ඇති බව නිගමනය විය.
- සමාජ එක්සත්භාවය සඳහා ජනමාධ්‍ය මගින් සැලකිය යුතු කාර්යභාරයක් සිදුකරන බව තරුණ විෂයෙහි පිළිගැනීමක් ඇති බව නිගමනය විය.

- ඒ අනුව, සමාජ එක්සත්භාවය සඳහා ජනමාධ්‍ය සැලකිය යුතු කාර්යභාරයක් සිදු කරන බව නිගමනය විය. එහිදී මූලික වශයෙන් පහත නිගමනයන්ට එළැඹිණි.
  - ජනමාධ්‍ය සෑම ජනවර්ගයකටම එක හා සමාන ලෙස අදහස් පළ කරන බව සැලකිය යුතු ප්‍රතිශතයකින් නිගමනය විය. ඒ අනුව සමාජ එක්සත්භාවය සහතික කිරීමේදී "විවිධ හඬවල් සඳහා වේදිකාවක් සැපයීම" ජනමාධ්‍ය සිදු කරන්නේ සැලකිය යුතු මට්ටමකින් බව නිගමනය විය.
  - ජනමාධ්‍ය ජනවාර්ගික අර්බුදය මැඩලිය හැකි සාමකාමී අදහස් හෙළිදරව් කිරීමට වැඩි වශයෙන් අවකාශයක් ලබා දෙන බව සැලකිය යුතු ප්‍රතිශතයකින් තහවුරු විය. ඒ අනුව සමාජයක් එක්සත්භාවයට අදාළ " ධනාත්මක කතා ඉස්මතු කිරීමේදී" සැලකිය යුතු කාර්යයක් ජනමාධ්‍ය මඟින් කරන බව නිගමනය විය.
  - පොදු ජන කොටස් එකඟ නොවන බෙදීම් ඇති කරවන කරුණු ජනමාධ්‍ය විසින් ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ නියැදියෙන් හරි අඩකට වැඩි (50%) කොටසක් නොපිළිගත් හෙයින් හා ජනවාර්ගික සමගිය වර්ධනයට ජනමාධ්‍ය අන්තර්ගත ඉදිරිපත් කරන බව සැලකිය යුතු පිරිසක් පිළිගත් හෙයින් සමාජයක් එක්සත්භාවයට අදාළ ජනවාර්ගික "ගැටුම් මැඩලීමේ කාර්යයේ" ජනමාධ්‍ය සැලකිය යුතු මට්ටමකින් නිරත වන බව නිගමනය විය.
  - ජනමාධ්‍ය වෛරී පණිවිඩ හා කටකතාවලට මායිම් වන බව සැලකිය යුතු ප්‍රමාණයකින් තහවුරු වීම හා ඊට සමාන ප්‍රතිශතයකින් කළකෝලාහල ඇතිවන අවස්ථා හෝ කැරලි කොලාහාල හැසිරීම් වලට හේතුවන සිතින් ප්‍රකාශයට ජනමාධ්‍ය වැඩි වශයෙන් තුඩු දෙන බව තහවුරු වීමෙන් "පොදු ජනමාධ්‍ය අන්තර්ගතයන් ඉදිරිපත් කිරීම" අඩු බව නිගමනය විය.
  - ජනමාධ්‍ය විසින් ප්‍රජාවන්ට සමාජ, දේශපාලන, ආර්ථික පණිවුඩ ආරවුලකින් තොරව විධිමත් පවත්වා ගැනීමට සැලකිය යුතු මට්ටමක කාර්යභාරයක් කරන බව තහවුරු වීම හා ජනමාධ්‍ය තුළින් සහජීවනයෙන් යුත් පැතිකඩ ගොඩනැගීම උදෙසා පණිවුඩ යෝජනා වීම වැඩි ප්‍රතිශතයකින් තහවුරු වූ හෙයින් සමාජ එක්සත්භාවය සඳහා "එක්සත් පණිවිඩ ප්‍රචලිත කිරීමේ කාර්යයේ" ජනමාධ්‍ය සැලකිය යුතු මට්ටමකින් නිරත වන බව නිගමනය විය.

  - ජනමාධ්‍ය මගීන් ජනවාර්ගික කණ්ඩායම්, සංස්කෘතීන් සහ විශ්වාස පද්ධති අනුව විවිධත්වය අගය කිරීම උදෙසා සංවර්ධන වැඩසටහන් දියත් කිරීම වැඩි ප්‍රතිශතයකින් තහවුරු හෙයින් සමාජ එක්සත්භාවය සඳහා "එක්සත් සංවර්ධන වැඩසටහන් දියත් කිරීමේ" කාර්යයේ නිරත වන බව නිගමනය විය.
  - වෛරය, ඊර්ෂ්‍යාව, පළිගැනීම ආදී අසම්මතයන්ගෙන් පිරී පවතින අර්බුදකාරී දෑ ජනමාධ්‍ය මඟින් ප්‍රචලිත වීම වැඩි ප්‍රතිප්‍රතිශතයකින් පිළිගැනීම නිසා "සාමකාමී වැඩසටහන් දියත් කිරීමේ කාර්යයේ" ජනමාධ්‍ය සැලකිය යුතු මට්ටමකින් නිරත නොවන බව නිගමනය විය.

- ජනමාධ්‍ය ආචාර ධර්මවලට අනුගත වීම තුළ සත්‍යවාදී බව සැලකිය යුතු ප්‍රමාණයකින් තහවුරු වීම, නිදහස අර්ථවත් වීම සැලකිය යුතු ප්‍රමාණයකින් තහවුරු වීම, හානිය අවම කිරීම අඩු ප්‍රතිශතයකින් තහවුරු වීම හා වගකිවයුතු බව ඉහළ ප්‍රතිශතයකින් තහවුරු වීම තුළ සමාජයක් එක්සත්භාවයට අදාළ "ජනමාධ්‍ය ආචාර ධර්මවලට අනුගත වීමේ කාර්යයේ" වැඩි ප්‍රතිශතයකින් නිරත වන බව නිගමනය විය.
- ජනමාධ්‍යයන්ගෙන් සමාජය එක්සත්භාවයට වැඩි දායකත්වයක් රූපවාහිනිය සිදුකරන බව තහවුරු වීම, පුවත්පත සැලකිය යුතු කාර්යයක් කරන බව තහවුරු වීම හා ගුවන් විදුලිය හා සිනමාව අඩු කාර්යයක නිරත වන බව නිගමනය විය.
- සෘජුව යොමු කරන ලද පැනයෙන් සමාජයක් එක්සත්භාවයට ජනමාධ්‍ය පිටුවහලක් වන බව තරුණ සිසුන් වැඩි ප්‍රතිශතයක් පිළිගන්නා බව නිගමනය විය.

මේ අනුව සමාජ එක්සත්භාවයට අදාළ මා තෝරාගත් කාර්යයන් තුළ වැඩි කාර්යය ප්‍රමාණයක් ජනමාධ්‍ය තුළින් සිදුකරන බව නිගමනය විය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


දැරංගල, එස්. (2007). ජනසන්නිවේදනය - සන්නිවේදන ප්‍රවේශය

පියධම්ම හිමි, අත්තරගොඩ. (2016). අසාමාන්‍ය මනෝවිද්‍යා ප්‍රවේශය, සමයවර්ධන, කොළඹ.

විජේසිංහ, ධනපාල, (2006). තොරතුරු තාක්ෂණයේ ව්‍යාප්තිය හා සංස්කෘතිය, මහාචාර්ය තිස්ස කාරියවසම් "අභිනන්දිකා" , ගොඩගේ ප්‍රකාශකයෝ, මරදාන.

Ambagamuwa, C. (2017). Journalism ethics, [online] Available at: https://www.facebook.com/gaqkln/posts, [Accessed 04, January 2024]

Abdirizak, G. (2013), The Role of Mass Media in Promoting National Cohesion: a Case Study of Marsabit County, [online] Available online at : http://erepository.uonbi.ac.ke/handle/11295/61291[Accessed 01, June 2024]

Bandara, S.E. (2016), The true side of harmony, [online] Available at: https://sinhala.news.lk/reviews/item/ [Accessed 04, January 2024]

Giddens, A. (2006). Sociology: Fifth Edition, Polity Press, Cambridge.

Guyo, A.G. (2011). [online] Available at: http://erepository.uonbi.ac.ke/bitstream/handle,\ [Accessed 04,January 2024]

Jakbowicz, A. (2007),The Media and Social Cohesion, [online] Available online at : https://www.researchgate.net/publication/297808971_The_media_and_social_cohesion[Accessed 02, June 2024]

Jure idini, R. & Poole, M. (2003). Sociology, Allen & Unwin,London.

Lewis, P.M. & Mitchell, C. (2015) ,Promoting social cohesion: the role of community media, , [online] Available online at : https://repository.londonmet.ac.uk/2579/1/Fomento-de-la-cohesi%C3%B3n-social.pdf[Accessed 02, June 2024]

Mbugua, S.W.(2023) Media for Peace and Cohesion, [online] Available online at : https://www.linkedin.com/pulse/media-peace-cohesion-skitter-m-ocharo-phd-hsc[Accessed 01, June 2024]

Merton, R. (1957). Social Theory and Social Structure, Free Press, New York.

Ofusori, A.E (2023), The role of the media in promoting social cohesion in South Africa, [online] Available online at : https://ddp.org.za/blog/2023/09/06/the-role-of-the-media-in-promoting-social-cohesion-in-south-africa/[01, June 2024]

Rachmawati ,D. (2020). Media/Communications on Peacebuilding/Social Cohesion/Changing Prevailing Narratives on Conflict, [online] Available at: http://erepository.uonbi.ac.ke/bitstream/handle [Accessed 04, January 2024]

Sashikala, D. (2020). What is Mass media, online] Available at: https://masscommunicationdulmi.blogspot.com: [Accessed 02, January 2024]

Skitter, M. (2023). Media for Peace and Cohesion, online] Available at: https://www.linkedin.com/pulse/media-peace-cohesion-skitter-m-ocharo-phd-hsc [online] [Accessed 05,January 2024]

Stefan, S. Ross, B. (2022).The Impact of Social Media on Social Cohesion, [online] Available at: https://www.cogitatiopress.com/mediaandcommunication/article/view/5792 [Accessed 06,January 2024]

Stieglitz, S.(2022),The Impact of Social Media on Social Cohesion: A Double-Edged Sword, [online] Available online at : https://www.cogitatiopress.com/mediaandcommunication/article/view/5792[Accessed 01, June 2024

Wikipedia (2023). The Society, [online] Available online at : https://si.m.wikipedia.org/wiki [Accessed 02,January 2024]

* **Received: July, 2024| Accepted: July, 2024| Revised: November, 2024**